# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,896—1970 මාර්තු 5 වැනි බ්‍රහස්පතින්ද—1970.3.5

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 177 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම ආදිය ... ... | 173 | මිළ පාලන දැන්වීම ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 174 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම ආදිය ... | 175 | ආදයම හා වියදම පිළිබඳ වාර්තා ... ... | — |
| වෙනත් පත් කිරීම ආදිය ... ... ... | 176 | ආණ්ඩුවේ වත්කම හා බැරකම ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම ... ... ... | 181 |
| | | " සුරාබදු ආඥාපනත " පිළිබඳ දැන්වීම ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1970 අංක 68**

අංකය : සී. 21/ආර්ජිසීපී/382.

### යුද්ධ හමුදාව—සථිර බල හමුදාව—රජය පාලනය කරවන උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරි තැන 1970 පෙබරවාරි මස 28 වෙනි දින සිට යුද්ධ හමුදා සථිර බල හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :—

මේජර් පරම් සෙල්වරාජා, ල. යු. පොදු සේ. බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970 පෙබරවාරි 26 දින,
කොළඹ දී ය.

3-1338

**1970 අංක 69**

අංකය : සී. 21/ආර්ජිසීපී/383.

### යුද්ධ හමුදාව—සථිර බල හමුදාව—රජය පාලනය කරවන උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක් හා විශ්‍රාම ගැනීමක්

**උසස් කිරීම**

පහත නම සඳහන් නිලධාරියා 1969 ජූනි මස 20 වැනි දින සිට මේජර් වශයෙන් :—

කපිතාන් (තාවකාලික මේජර්) සාලිය නිමල් දොරනෑගම, ගැ. හේ. බ.

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 1970 මාර්තු මස 1 වැනි දින සිට යුද්ධ හමුදා සථිර බල හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :—

මේජර් සාලිය නිමල් දොරනෑගම, ගැ. හේ. බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970 පෙබරවාරි 26 දින,
කොළඹ දී ය.

3-1337

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 අංක 70

අංකය : ඩී. 250/ආර්ඊසීපී/3.

## යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—රජය පාලනය කරවන උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 1969 ජූනි මස 1 වැනි දින සිට තාවකාලික මේජර් වශයෙන් :—

කපිතාන් මාපිටියගේ සරත්චන්ද්‍ර විජේසිංහ, ල. ඉ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්‍ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි 26 දින,
කොළඹ දී ය.

3-1372

---

1970 අංක 71

අංකය : ඩී. 250/ආර්ඊසීපී/3.

## යුද්ධ හමුදව—ස්ථිර බල හමුදව—රජය පාලනය කරවන උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට තාවකාලික මේජර් වශයෙන් :—

කපිතාන් විල්ප්‍රඩ් හරිශ්චන්ද්‍ර තිරිඇල්ල, ල. යු. පොදු. සේ. බ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි 26 දින,
කොළඹ දී ය.

3-1363

---

1970 අංක 72

අංකය ඩී. 23/ආර්ඊසීපී/155.

## රාජකීය ලංකා ගුවන් හමුදව—රජය පාලනය කරවන උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

**1970 පෙබරවාරි මස 15 දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම**

පයිලට් ඔපිසර් විජේසේකර රාජකරුණා මුදියන්සේලාගේ ක්‍රිස්ටි බර්නාර්ඩ් ගුණතිලක. (පාලන/උපකරණ)

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි මස 25 දින,
කොළඹ දී ය.

3-1339

---

# රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 73

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත්වීම් නියෝග කර ඇත :—

ඒ. 96/67.

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ, ජනපද නිලධාරි එස්. ඩබ්ලිව්. හේරත් මහතා 1968 දෙසැම්බර් 1 වැනි දින සිට දිස්ත්‍රික් ඉඩම් නිලධාරියෙකු ලෙස වැඩ බැලීමට.

ඒබී. 49/67.

වැඩ බලන නියෝජ්‍ය පොලිස්පතිවරුන් වන සී. ආර්. ආර්න්ට්, ඩී. එස්. ඊ. පී. ආර්. සේනානායක සහ ඇම්. බී. ඇදිගම යන මහතුන් 1968 දෙසැම්බර් 1 වැනි දින සිට නියෝජ්‍ය පොලිස්පතිවරුන් ලෙස.

වැඩ බලන නියෝජ්‍ය පොලිස්පති ජේ. වැන්සැන්ඩන් මහතා; 1969 පෙබරවාරි 22 දින සිට නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු ලෙස.

ඒඒ. 86/69.

සී. එම්. පෙරේරා මහතා 1969 ඔක්තෝබර් 1 වැනි දින සිට මහා මාර්ග දෙපාර්තමේන්තුවේ මහා මාර්ග අධ්‍යක්ෂ ලෙස වැඩ බැලීමට.

ඒඒ. 95/69.

ටී. ගුණරත්නම් මහතා 1969 ඔක්තෝබර් 1 වැනි දින සිට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

ඒ. 46/69.

ලංකා පරිපාලන සේවයේ ඒ. බී. ජයසුන්දර මහතා 1969 ඔක්තෝබර් 1 වැනි දින සිට නැවත නියම කරන තුරු මහා භාණ්ඩාගාරයේ පරිපාලන අභ්‍යාස ආයතනයේ අභ්‍යාස හා පර්යේෂණ කටයුතු ආශ්‍රිත තනතුරක වැඩ බැලීමට.

ඒ. 7/69.

සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පන්තියේ 1 වැනි ශ්‍රේණියේ, ඩබ්ලිව්. කේ. ආරියපාල මහතා 1969 ඔක්තෝබර් 5 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ගාල්ල පාලන දිස්ත්‍රික්කයේ (මහජන සම්බන්ධතා) ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන් වැඩ බැලීමට.

ඒ. 46/69.

ලංකා පරිපාලන සේවයේ ආර්. එම්. විතාන මහතා 1969 ඔක්තෝබර් 11 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, මහා භාණ්ඩාගාරයේ පරිපාලන අභ්‍යාස ආයතනයෙහි අභ්‍යාස හා පර්යේෂණ කටයුතු ආශ්‍රිත තනතුරක වැඩ බැලීමට.

ඒ. 60/68.

ලංකා පරිපාලන සේවයේ එන්. අබේවික්‍රම මහතා 1969 නොවැම්බර් 2 වැනි දින සිට නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් ලෙස වැඩ බැලීමට.

ඒ. 10/68.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්, කේ. එස්. පරාක්‍රම මහතා 1969 දෙසැම්බර් 7 වැනි දින සිට නියෝජ්‍ය කොමසාරිස් ලෙස වැඩ බැලීමට.

ඒ. 86/69.

ලංකා පරිපාලන සේවයේ එස්. ජේ. සුමනසේකර බණ්ඩා මහතා 1969 දෙසැම්බර් 15 වැනි දින සිට සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර අභ්‍යාස විද්‍යාලයේ විද්‍යාලයාධිපති ලෙස වැඩ බැලීමට.

ඒ. 33/68.

ලංකා පරිපාලන සේවයේ එම්. සෙනෙවිරත්න බණ්ඩා මහතා 1969 දෙසැම්බර් 17 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ප්‍රවෘත්ති සහ ගුවන් විදුලිය පිළිබඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම් ලෙස වැඩ බැලීමට.

ඒබී. 111/69.

සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (වෛද්‍ය සේවා) වෛද්‍ය සී. එස්. එච්. පී. ජයසූරිය මහතා 1970 ජනවාරි 2 වැනි දින සිට සිය රාජකාරිවලට අමතරව, සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (මහජන සෞඛ්‍ය සේවා) තනතුරට ස්ථිර පත්වීමක් කරන තෙක්, එම තනතුරෙහි වැඩ බැලීමට.

ඒ. 3/70.

ලංකා පරිපාලන සේවයේ ආර්. ටී. රත්නතුංග මහතා 1970 ජනවාරි 11 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ අතිරේක ස්ථිර ලේකම් ලෙස වැඩ බැලීමට.

ඒ. 3/70.

එල්. බී. ටී. ප්‍රේමරත්න මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළදී නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් තැන්පත් ඊ. ආර්. කේ. ඩී. එම්. එච්. දෙහෙරගොඩ මහතා 1970 ජනවාරි 14 වැනි දින සිට සොලිසිටර් ජනරාල් තනතුරෙහි වැඩ බැලීමට.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 පෙබරවාරි 24 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංක 500,
කොළඹ 1.

3-1280

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1970 අංක 74**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඑම්/ජී.40/66

ජේ. ජී. එල්. ස්වාරිස් මහතා වැඩ භාර ගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, වී. එන්. ඒ. ඩබ්ලිව්. වික්‍රමසූරිය මහතා 1970 පෙබරවාරි මස 22 වැනි දින සිට මීගමුවේ දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වෙස්ට් කොමසාරිස් තැන, සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑම්/ජී. 40/66

එච්. ඩබ්ලිව්. සේනානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එස්. එස්. කොරයා මහතා 1970 පෙබරවාරි මස 22 වැනි දින, හම්බන්තොට මහෙස්ත්‍රාත් තැන, රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඒ. 14/48 (1)

කේ. වී. ස්වර්ණාධිපති මහතා ඔහුගේ වෙනත් රාජකාරී වලට අතිරේක වශයෙන්, කොළඹ ඒ. ම. උ. අංක 33332 දරණ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස, 1970 මාර්තු මස 28 දින සිට කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංක : ජේඑල්/ඞී. 20/57

ඞී. ඊ. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. ආසිර්වාදම් මහතා 1970 පෙබරවාරි මස 15 සහ 18 වැනි දිනයන්හී, රත්නපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඞී. 26/63

එම්. ඊ. ධර්මවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. සූරවීර මහතා 1970 මාර්තු මස 2 දින සිට 9 වැනි දින දක්වා, කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/අයි. 2/66

ආර්. ඉලෙපෙරුම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. කුලතුංග මහතා 1970 මාර්තු මස 3 දින සිට 9 දින දක්වා, මාතර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 11/64

එස්. ජේ. ඞී. ද එස්. විජයරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ජේ. පීරිස් මහතා 1970 මාර්තු මස 2 දින සිට 8 දින දක්වා, බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ආර්. 12/57

පී. බී. රඹුක්වැල්ල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඞී. සී. ඊ. වී. කරුණාරත්න මහතා 1970 පෙබරවාරි මස 19 දින සිට 21 දින දක්වා, මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 29/63

එම්. ෂන්මුගලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එලියතම්බි මහතා 1970 මාර්තු මස 3 දින සිට 9 දින දක්වා, නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ හැටන්හි ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/වී. 2/67

කේ. වික්නරාජා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. ඥාණචන්ද්‍රන් මහතා 1970 මාර්තු මස 3 සහ 9 වැනි දිනයන්හි. පේදුරුතුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන. අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/වී. 2/67

කේ. වික්නරාජා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. රත්නසිංහම් මහතා 1970 මාර්තු මස 4, 5 සහ 6 වැනි දිනයන්හි, පේදුරුතුඩුව අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 12/66

එන්. බී. ඞී. එස්. විජේසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඊ. විජේතුංග මහතා 1970 පෙබරවාරි මස 18 දින, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ආර්. 8/63

එම්. පී. සී. රත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එම්. විජේසූරිය මහතා 1970 පෙබරවාරි මස 24 සහ 25 වැනි දිනයන්හි, බම්බලපිටියේ පිහිටි උසාවියේ ක්‍රියා කරන කොළඹ අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ආර්. 8/63

එම්. පී. සී. රත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඊ. එස්. වික්‍රමරත්න මහතා 1970 පෙබරවාරි මස 23 දින, බම්බලපිටියේ පිහිටි උසාවියේ ක්‍රියා කරන කොළඹ අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 28/62

කේ. වී. ස්වර්ණාධිපති මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඕ. එම්. තහීර් මහතා 1970 පෙබරවාරි මස 18 දින සහ 23 වැනි දින සිට 25 වැනි දින දක්වා, කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/යූ. 1/51

සී. වී. උඩලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එල්. එස්. වික්‍රමසිංහ මහතා 1970 මාර්තු මස 4 සහ 5 වැනි දිනයන්හි, ගාල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජී. 13/64.

එස්. බී. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එස්. රාජපක්ෂ මහතා 1970 පෙබරවාරි මස 20 දින සිට 25 වැනි දින දක්වා, හලාවත සහ පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 31/65

ඞී. එස්. ඞී. පී. ආර්. සේනානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. එස්. ඒ. පෙරේරා මහතා 1970 පෙබරවාරි මස 20 දින සිට 23 දින දක්වා, කුලියාපිටියේ පළාත් ආණ්ඩු සභා සීමාව තුළ, කනදුල්ලේ පිහිටි උසාවියේ ක්‍රියා කරන කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 24/59

එස්. සෙල්ලයියා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. තියාගරාජා මහතා 1970 මාර්තු මස 2 දින සිට 12 දින දක්වා, මාතලේ ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 26/61

ජේ. සේනාධිරාජා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එල්. එන්. වික්‍රමසිංහ මහතා 1970 මාර්තු මස 3 දින සිට 7 දින දක්වා, ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/කේ. 2/57

කේ. වී. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සිමම්පිල්ලේ මහතා 1970 පෙබරවාරි මස 6 වැනි දින සිට 7 වැනි දින දක්වා, මන්නාරමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/එස්. 7/49

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. වී. විල්වරාජා මහතා 1970 පෙබරවාරි මස 14 වැනි දින සිට 15 වැනි දින දක්වා, වව්නියාවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/එන්. 7/49

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. වී. විල්වරාජා මහතා 1970 පෙබරවාරි මස 15 වැනි දින, වව්නියා සහ මන්නාරම් දිස්ත්‍රික්කයන්හි, වව්නියා දකුණ ගම්බද උසාවි සභාපති සහ මාන්තෙයි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය :පීඑල්/එන්. 4/68

කේ. නාගලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ඒ. මජීඩ් මහතා 1970 පෙබරවාරි මස 11, 12, 13, 15, 16, 18, 19, 20, 22 සහ 23 දිනයන්හි, කල්මුනේ දිස්ත්‍රික්කයේ කරවාකු සහ නින්තවූර් පත්තු, සමන්තුරේ පත්තු සහ වැව්ගම් පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 10/63

පී. ජේ. එස්. ඒ. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, අර්වින් ප්‍රනාන්දු මහතා 1970 පෙබරවාරි මස 18 වැනි දින සහ 19 වැනි දින, නලවත දිස්ත්‍රික්කයේ උතුරු සහ දකුණු පිටිගල් කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 5/53

ඒ. බී. අළුවිහාරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ටී. ඉලංගන්තිලක මහතා 1970 පෙබරවාරි මස 18, 19 සහ 20 වැනි දිනයන් හි, මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ හාරිස්පත්තු සහ පහත හේවාහැට, උඩ හේවාහැට ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 7/57

ඇම්. ඇම්. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජී. සූරියආරච්චි මහතා 1970 පෙබරවාරි මස 16 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව, නිකවැරටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයන් හි ගම්බද උසාවි සභාපති සහ හිරියාල නත්පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 9/61

එම්. ඒ. සී. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. කිව්. සලගහකෝන් මහතා 1970 පෙබරවාරි මස 19 වැනි දින, මීගමුව දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ උතුර ඒ සහ බී, අළුත්කුරු කෝරලේ දකුණ සහ සියනෑ කෝරලේ බටහිර (අධිකාරි පත්තුව) ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/කේ. 8/64

එස්. කඩවතආරච්චි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. සී. ටී. මුණමලේ මහත්මිය, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය, පන්නල, බිංගිරිය සහ දේවමැදි හත්පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන් හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/යූ. 2/48

ජේ. ඩබ්ලිව්. බී. උඳලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, බී. එල්. ග්‍රේ මහතා 1970 පෙබරවාරි මස 23 වැනි දින, කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ කිනිගොඩ බෙලිගල් සහ පරනකුරු කෝරලයන් හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 11/64

ඒ. ඩී. එම්. කේ. පෙතියාගොඩ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. වික්‍රමතුංග මහතා 1970 පෙබරවාරි මස 10 වැනි දින, මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ වැලිගම් කෝරලේ සහ ගඟබොඩ පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : සීජේකිව්/ඒ. 9/68

අල්හජ්. එම්. සී. එම්. හසන් මහතා ඔහුගේ වෙනත් රාජකාරි වලට අතිරේක වශයෙන් 1970 පෙබරවාරි මස 20 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, මහනුවර දිස්ත්‍රික්කයේ උඩ දුම්බර, මැද දුම්බර සහ පහත දුම්බර ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශයන් හි ක්වාසි වශයෙන් වැඩ බැලීමට.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 පෙබරවාරි මස 25 දා,
කොළඹ 12,
තැ. පෙ. අංකය 573,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී.

3-1341/1

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන ලද උසස් කිරීම් සහ ස්ථිර කිරීම්

අංකය : සීජේපී/ඩී. 12/48

1970 ජනවාරි මස 23 දිනැති අංක 14,890 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ 1970 අංක 26 දරණ නිවේදනයේ සඳහන් ලංකා අධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වශයෙන් වූ බී. ජී. එස්. ඩේවිඩ් මහතාගේ පත්වීම 1969 ජූනි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

අංකය : සීජේපී/පී. 7/66

ලංකා අධිකරණ සේවයේ නිලධාරියෙකු වශයෙන් වූ කේ. පාලකිඩ්නර් මහතාගේ පත්වීම 1967 පෙබරවාරි මස 25 දින සිට මෙයින් ස්ථිර කරනු ලැබේ.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 පෙබරවාරි මස 25 දා,
කොළඹ 12,
තැ. පෙ. අංකය 573,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී.

3-1341/2

---

## වෙනත් පත්කිරීම් ආදිය

**1970 අංක 75**

අංකය ඩී. 251/ආර්ජීසීර්/2.

### නිලධාරීන්ගේ ස්ථිර කිරීම්—රාජකීය ලංකා නාවික හමුදාව

1966 සැප්තැම්බර් මස 1 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ලුතිනන් (ඉ) පදවියේ ස්ථිර කර ඇත:—

වැඩබලන ලුතිනන් (ඉ) ටී. ජේ. පී. ද සිල්වා, රා. ලං. නා. හ.

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි මස 20 දින,
කොළඹ දී ය.

3-1340

---

**1970 අංක 76**

පා 4/සාවි 6/38, පා 4/සාවි 28/142, පා 4/සාවි 32/43, පා 4/සාවි 25/21, පා 4/සාවි 25/21, පා 4/සාවි 37/89, පා 4/සාවි 28/53, පා 4/සාවි 28/129, පා 4/සාවි 2/331, පා 4/සාවි 37/119, පා 4/සාවි 20/159, පා 4/සාවි 29/55.

### අධිකරණ ආඥාපනත

**82 වන වගන්තිය යටතේ දැන්වීම**

(6 වන අධිකාරය වූ) අධිකරණ ආඥාපනතෙහි 82 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ඇලෙක්සැන්ඩර් ෆ්‍රෙයාර්ලි විජේමාන්න වන මම—

1. කොතලාවල අප්පුහාමිල්ලාගේ දොන් දියෝනිස් කොතලාවල මහතා අවිස්සාවේල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

2. රූපසිංහ ආරච්චිගේ හරිස්චන්ද්‍ර රූපසිංහ මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
3. දිසානායක මුදියන්සේලාගේ රංහාමි අරාච්චිලාගේ හීන්බණ්ඩා මහතා අනුරාධපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චය කාර වරයෙකු වශයෙන් ද,
4. මුත්බාපොඩි තම්බිපිල්ලෙයි මහතා මඩකලපුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
5. අල්හාජ් සික්න්දර් මොහමඩ් ඉස්මයිල් හජ්ජියාර් මහතා මඩකල පුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
6. මොහමඩ් සහීඩ් මොහමඩ් පලීල් මහතා රත්නපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
7. වාසල මුදියන්සේලාගේ රත්බණ්ඩා මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
8. හේරත් මුදියන්සේලාගේ ඩිංගිරිබණ්ඩා හේරත් මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
9. අරුණා වික්‍රමපාල මහත්මිය කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරියක වශයෙන් ද,
10. සේනුදීන් මරික්කාර් මොහමඩ් ෂාෆි මහතා අවිස්සාවේල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
11. විරකතිපිල්ලෙයි නවරත්නරාජා මහතා යාපනය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
12. වර්ණකුලසූරිය විල්ප්‍රඩ් පීරිස් මහතා හලාවත අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

පත් කරමි.

ඒ. එෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1970 පෙබරවාරි 25 වැනි දින ,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

3-1330

---

1970 අංක 77

## නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)

දියගු බදුරගේ ඩැනී ද සිල්වා මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ක්වූ පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දීය.

3-1159

---

1970 අංක 78

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

ක්‍රිස්ටෝපර් විජිත ලක්ෂමන් සෙනෙවිරත්න කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ක්වූ පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹදීය.

3-1161

---

1970 අංක 79

## නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)

දිසානායක මුදින්සේලාගේ ගුණරත්න බණ්ඩා ඉඹුල්දෙණිය මහතා මහනුවර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ක්වූ පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දීය.

3-1158

---

1970 අංක 80

## නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)

නිමලසේන උපාලි අගම්පොඩි විජයසිරිවර්ධන මහතා අම්බලම්ගොඩ වාසස්ථානය සහ කාර්යාලය ද, තොටගමුවේ අතුරු කාර්යාලය ද ඇතිව බලපිටිය අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත්කර තිබේ.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ක්වූ පෙබරවාරි මස 18 දින,
කොළඹ දී ය.

3-1235

---

# ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඞී.—බී. 7/63.

## 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත

### 16අ වැනි වගන්තිය යටතේ දැන්වීම

1969 අංක 6 දරණ පනතින් සංශෝධිත 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 16අ වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති උක්කු බණ්ඩා වන්නිනායක වන මම මෙහි උපලේඛනයේ දැක්වෙන එක් එක් ආයතනය එකී වගන්තියේ කාර්යයන් සඳහා පිළිගත් පුණ්‍යායතනයක් යයි මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

යූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1970 පෙබරවාරි මස 22 වෙනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

1. ඉසිපතන කණිෂ්ඨ විද්‍යාලයීය ගුරු-දෙගුරු සංගමය—ගොඩනැගිලි අරමුදල
2. නීති කොමිෂන් සභාවේ අරමුදල
3. තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමය—පානදුර.

3-1155

---

## මිල පාලන පනත

(විවිධ ද්‍රව්‍ය) මිල පාලක විසින් පනවනු ලැබ, 1970 ජනවාරි 31 වැනි දින අංක 14,891/3 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ, 1970 අංක 1 දරණ මිල පාලන (ආනයනය කරන ලද රෙදිපිළි) ආඥව, රාජ්‍ය කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතෙහි 4 (7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආනන්ද තිස්ස ද අල්විස්,
රාජ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි 26 දින,
කොළඹ.

3-1283

---

## සමිති ආඥපනත

(123 වැනි අධිකාරය වන) සමිති ආඥපනතෙහි 3 වැනි සහ 4 වැනි වගන්තිවලින් මා වෙත පැවරුන බලතල ප්‍රකාර, වාණිජ සහ වෙළඳ ඇමති, වර්ණකුලසූරිය ඉච්චාම්පුල්ලිගේ හියු ප්‍රනාන්දු වන මම මේ නිවේදනයෙන්—

"සීමාසහිත මහා මහින්ද ජාත්‍යන්තර ධර්මදූත සමිතිය" යන නමින් යුත් සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථය ඒ ආඥ පනතෙහි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළ යුතු පරමාර්ථයක් වශයෙන් නියම කරමි.

හියු ප්‍රනාන්දු,
වාණිජ සහ වෙළඳ ඇමති.

1970 පෙබරවාරි මස 20 දින,
කොළඹ දී ය.

3-1282

ලයනල් ගුණතිලක මහතා සහ පී. ඞී. කලුත්නාතිලක මහතා ඉල්ලා අස්වීමෙන් ඇති වූ පුරප්පාඩු පිරවීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් මෙහි පහත සඳහන් අය, ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් සඳහන් කර ඇති දින සිට, 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 8 වැනි වගන්තිය යටතේ පත්කිරීමට ගරු ජනසතු සේවා ඇමතිතුමා සතුටු වී ඇති බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඔවුන්ගේ ධුර කාලය 1970 පෙබරවාරි මස 28 වැනි දිනයෙන් අවසන් වේ.

ඔවුන්ගේ පත්වීම් ඉහතකී පනතේ, 8 වැනි වගන්තියේ (4) වැනි සහ (5) වැනි උප වගන්තිවල විධිවිධානයන්ට යටත් වනු ඇත.

1. ඒ. එම්. එස්. පෙරේරා මහතා, 1970.1.8 දින.

2. නෝර්මන් වෛද්‍යරත්න මහතා, 1970.1.9 දින.

වී. එම්. පීරිස්,
ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි මස 24 දින,
කොළඹ 1,
ජනසතු සේවා අමාත්‍යාංශයේ දී ය.

3-1275

---

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් සිත්තයියා කතිර්ගාමලිංගම් මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත දෙමළ භාෂාවෙන්ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් අවසර දී තිබේ.

ඒ. ඊ. ගෝගර්ලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ක්වූ පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දීය.

3-1162

---

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

(චොකලට් සෑදීම ඇතුළු) විස්කෝතු සෑදීමේ හා රස කැවිලි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයෙකුව සිට ඉල්ලා අස් වූ ඞී. බී. ගුණසේකර මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයෙකු ලෙස පෙනී සිටීමට පඩිපාලක සභා ආඥාපනතේ (136 වන අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා රැකීරක්ෂා ඇමතිතුමන් විසින් ඇස්. ජෝශප් මහතා පත් කරන ලද බව වර්ෂ 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජී. පී. තම්බයියා,
කම්කරු හා රැකීරක්ෂා අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි මස 15 වැනි දින,
කොළඹ දී ය.

3-1306

---

ඇල්.ඞී.බී 26/48.

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

(136 වැනි අධිකාරය වන) පඩි පාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උප ලේඛනයෙහි නිශ්චිතව සඳහන් සභාවේ තීරණයන් ඒ උපලේඛන යෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට, ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව අදහස් කරන බව එකී පඩිපාලක සභා ආඥා පනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒ සභාව විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරුද්ධතාව යන් 1970 මාර්තු මස 25 දින දවල් 12 දක්වා එම පඩිපාලක සභාවේ සභාපතිවරයා විසින් භාර ගනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන එබඳු සෑම විරුද්ධතාවයක්ම එසේ විරුද්ධ වීමට හේතුවූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් කළ යුතුය.

ආර්. එල්. ගුණසේකර,
ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ පඩි පාලක
සභාවේ සභාපති.

1970 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1945 අගෝස්තු මස 10 වැනි දින අංක 9,447 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූද, 1967 ඔක්තෝබර් මස 29 වැනි දින අංක 14,772/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් අවසාන වරට වෙනස් කරන ලද්දාවූද, තීරණ, එම උපලේඛනයෙහි II වන කොටසෙහි පහත දැක්වෙන පරිද්දෙන් තවදුරටත් වෙනස් කළ යුතුය :—

"කාල මිම්මේ වැඩ සඳහා වූ පඩිවල අවම ප්‍රමාණය" යන උප ශීර්ෂය යටතේ එහි වූ 2 වැනි තීරයේ—

(අ) "නුපුහුණු කම්කරුවෝ", යන කරුණට අදාල "4.50", යන ඉලක්කම් වෙනුවට "5.85", යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) "අඩ පුහුණු කම්කරුවෝ", යන කරුණට අදාල "5.00" යන ඉලක්කම් වෙනුවට "6.35", යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඇ) "පුහුණු කම්කරුවෝ", යන කරුණට අදාල "5.60", යන ඉලක්කම් වෙනුවට "6.95", යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඈ) "කංකානම්වරු", යන කරුණට අදල "5.10", යන ඉලක්කම් වෙනුවට "6.45", යන ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(උ) "මුරකරුවෝ", යන කරුණට අදාල "5.00", යන ඉලක්කම් වෙනුවට "6.35", යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඌ) (වෘත්තීය හදාරන්නන් සහ ආධුනිකයෝ යන උපශීර්ෂය යටතේ දක්වෙන) "I වැනි අවුරුද්ද", යන කරුණට අදාල "2.60", යන ඉලක්කම් වෙනුවට "3.95", යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඉ) (වෘත්තීය හදාරන්නන් සහ ආධුනිකයෝ යන උප ශීර්ෂය යටතේ දැක්වෙන) "II වැනි අවුරුද්ද" යන කරුණට අදාල "3.10", යන ඉලක්කම් වෙනුවට "4.45", යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඊ) (වෘත්තීය හදාරන්නන් සහ ආධුනිකයෝ යන උප ශීර්ෂය යටතේ දැක්වෙන) "III වැනි අවුරුද්ද", යන කරුණට අදාල "3.60", යන ඉලක්කම් වෙනුවට "4.95" යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ඔ) (වෘත්තීය හදාරන්නන් සහ ආධුනිකයෝ යන උපශීර්ෂය යටතේ දැක්වෙන) "IV වැනි අවුරුද්ද" යන කරුණට අදාල "4.10", යන ඉලක්කම් වෙනුවට "5.45" යන ඉලක්කම් ආදේශ කිරීමෙන්ද,

3-1344

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1969 ජනවාරි 13 වන දින අංක 14,836/3 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් මොහමඩ් හනීෆා මොහම්මදු නයිනා මරික්කාර් වන මම—

(අ) 1969 ජූනි 6 දින අංක 14,857 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛන යෙහි අංක 19 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ දෙනියාය ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායක සින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

1. කොළවෙනිගම, පල්ලෙගම, අඹගහහේන පදිංචි කර්නේලිස් විජේනායක ජයවර්ධන මහතා.

2. දෙනියාය, ස්ටුඩියෝ සාන්ති හි පදිංචි හේවා බඹරන්දෙගේ වෝල්ටර් මහතා.

3. දෙනියාය, ස්ටුඩියෝ සාන්ති හි පදිංචි ඉම්යාගේ දෝන නන්දාවතී ජයසේකර මහත්මිය.

4. දෙනියාය, පන්සල පාරේ පදිංචි අදිරියන් වෙරලගේ එඩී මහතා.

5. දෙනියාය, කොල්ලකන්ද පදිංචි උක්වත්ත හේවගේ ලුවිනිස් මහතා.

6. කොළවෙනිගම, පල්ලෙගම, පදිංචි ඇල්ගොඩ රණවකගේ අමරපාල මහතා.

7. කොළවෙනිගම, පල්ලෙගම, "නිර්මලා" හි පදිංචි ආරිය දාස විජේනායක මහතා.

8. කොළවෙනිගම, උඩදෙනියවත්ත පදිංචි ප්‍රේමරත්න විජේ නායක මහතා.

9. දෙනියාය, මෙදේරිපිටිය පදිංචි හැන්රි මාර්ෂල් රත්නායක මහතා.

10. දෙනියාය, "සිල්ව ඩේල්" හි පදිංචි ඇලන්සන් සමර සිංහ මහතා.

11. කොළවෙනිගම, පල්ලෙගම, "ප්‍රගති" හි පදිංචි ආරියදාස ජයවර්ධන දිසානායක මහතා.

12. දෙනියාය, කළුගල්හේන පදිංචි දික්කුඹුරගේ පේමදාස මහතා.

13. කොටපොල, කොටපොල දකුණ පදිංචි ජිනදාස විජේසිංහ මහතා.

14. දෙනියාය, මහවීදියේ පදිංචි මැනික් පුරගේ එදොරිස් මහතා.

15. දෙනියාය, විහාරහේන පදිංචි ඩී. ජේ. ජයවර්ධන මහතා.

16. දෙනියාය, මහවීදියේ පදිංචි ලමාහේවාගේ චන්ද්‍රදාස මහතා.

17. දෙනියාය, මහවීදිය අංක 210 හි පදිංචි කරුණාරත්න උබේසේකර මහතා.

18. දෙනියාය, බටේයාය පදිංචි ඌරගහ බාර්ලිස් සිල්වා මහතා.

19. කොටපොල, කොටපොලවත්ත කඩයේ පදිංචි ඩී. ඩී. ජයසේකර මහතා.

20. දෙනියාය, මහවීදියේ පදිංචි පැලෑන වඩුගේ සිරිසේන මහතා.

21. දෙනියාය, රෝහල පාරේ පදිංචි බදුල්ලේ ලියනගේ ඇල්ප්‍රඩ් මහතා.

22. දෙනියාය, යාපිටිකන්ද පදිංචි සෝමන් ගොඩගේ සුගත දාස මහතා.

23. දෙනියාය, පන්සල පාරේ පදිංචි බඹරුන්දගේ අරලියස් මහතා.

24. දෙනියාය, පන්සල පාරේ පදිංචි බාරොන් සිංඤෝ අබේ රත්න මහතා.

(ආ) කොළවෙනිගම, පලේලේගම, අඹගහහේන පදිංචි කර්නේලිස් විජේනායක ජයවර්ධන මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බවද මෙයින් නිශ්චය කරමි.

එම්. එච්. එම්. නයිනා මරික්කාර්,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 පෙබරවාරි මස 24 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

3-1284

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1969 ජනවාරි 13 වන දින අංක 14,836/3 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් මොහමඩ් හනීෆා මොහම්මදු නයිනා මරික්කාර් වන මම—

(අ) 1968 මාර්තු 22 දින අංක 14,794 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 9 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ කොටවෙර ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) බෝවල, උළුගල, පූජ්‍ය උණපාන විමලනන්ද ස්ථවිරයන් වහන්සේ,

(2) වැලිමඩ, කොටවර-උඩගම, තලාවත්ත පදිංචි ලියදිපිට අප්පුහාමි මුදියන්සේලාගේ උක්කුබණ්ඩා මහතා,

(3) වැලිමඩ, හංගිලිඇල්ල පදිංචි කේ. ආර්. ඩී. පුංචිහතා මහතා,

(4) බෝවල, යහලඅරාව පදිංචි කේ. ආර්. ඩී. මද්දිලියා මහතා.

(5) වැලිමඩ, කහටපිටිය පදිංචි ටී. ජී. නන්දිසේන මහතා,

(6) බෝවල, දවටගම පදිංචි ඩබ්ලිව්. ඩී. බබානිස් මහතා,

(7) බෝවල, මැටිවලලන්ද පදිංචි කේ. ආර්. ඩී. කිරිහතා මහතා,

(8) බෝවල, යහලඅරාව, හන්දිය ගෙදර පදිංචි ඩබ්ලිව්. ඩී. සයිමන් මහතා,

(9) බෝවල, දවටගම, පදිංචි ඊ. වී. ඩී. සයිමන් මහතා,

(10) බෝවල, මැටිවලලන්දගම පදිංචි ජේ. ඩී. සුද්දනා මහතා,

(11) වැලිමඩ, කැන්දගොල්ල, ගොඩතාර පදිංචි ඇන්. පී. මයිමා මහතා,

(12) වැලිමඩ, කැන්දගොල්ල, මැදගෙදර පදිංචි කේ. ඩී. මයිමා මහතා,

(13) වැලිමඩ, කැන්දගොල්ල, මැදගෙදර පදිංචි කේ. ඩී. සුද්දනා මහතා

(14) වැලිමඩ, කැන්දගොල්ල, මැදගෙදරවත්ත පදිංචි කේ. ඩී. පුංචිකිරා මහතා,

(15) වැලිමඩ, කැන්දගොල්ල, තොටුපොලවත්ත පදිංචි ඇන්. පී. විජේසිරි මහතා,

(16) වැලිමඩ, කැන්දගොල්ල, උනම්බියාගොඩ පදිංචි ඇන්. ඩී. නිපුනා මහතා.

(17) වැලිමඩ, කොටවර-උඩගම, තලාවත්ත, අළුත්ගෙදර පදිංචි මාරසිංහ මුදියන්සේලාගේ සුදුබණ්ඩා මහතා,

(18) වැලිමඩ, කොටවර-උඩගම, "තිලක නිවස" හි පදිංචි හුදුබණ්ඩා මාරසිංහ මහතා,

(19) වැලිමඩ, කොටවර-පහලගම, වේරගොඩවත්ත පදිංචි කලුබණ්ඩා රත්නායක මහතා,

(20) වැලිමඩ, කොටවර-පහලගම, දිසානායක ගෙදර පදිංචි දිසානායක මුදියන්සේලාගේ කිරිබණ්ඩා මහතා,

(21) වැලිමඩ, කොටවර-පහලගම, "සිරිමැදුර" හි පදිංචි රත්නායක මුදියන්සේලාගේ පියසේකර මහතා,

(22) ලුනුවත්ත, ඇලිවෙලගම, බොරගස්කැපිය පදිංචි රත්නායක මුදියන්සේලාගේ මුතුබණ්ඩා මහතා,

(23) ලුනුවත්ත, දොඹේවෙල, ලන්දෙවත්ත පදිංචි විනී වික්‍රමසිංහ මහතා,

(24) බෝවල, උළුගල පදිංචි කේ. ඩී. පොඩිඩා මහතා,

(25) බෝවල, දවටගම පදිංචි ඩබ්ලිව්. ඩී. ජේම්ස් මහතා,

(26) වැලිගම, කොටවර-පහලගම, "සිසිර සෙවන" හි පදිංචි ආර්. එම්. ගුණසේකර මහතා,

(27) ලුනුවත්ත, වැලිඅරාව, බෝපිටිය පදිංචි කේ. බී. දසනායක මහතා,

(28) ලුනුවත්ත, වැලිඋල්ල, හත්පංගුව පදිංචි ආර්. එම්. පුංචිරාල මහතා,

(29) බෝවල, උළුගල පදිංචි ඩබ්ලිව්. සමරතුංග මහතා,

(30) වැලිමඩ, කොටවර-උඩගම, පිටවත්ත පදිංචි මාරසිංහ මුදියන්සේලාගේ සුදු බණ්ඩා මහතා.

(ආ) වැලිමඩ, කොටවර-උඩගම, තලාවත්ත පදිංචි ලියදිපිට අප්පුහාමි මුදියන්සේලාගේ උක්කු බණ්ඩා මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

එම්. එච්. එම්. නයිනා මරික්කාර්,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

3-1359

## නගර සහ ග්‍රාම නාම වෙනස් කිරීම

පහත සඳහන් පළමුවෙනි උපලේඛනයේ නගර සහ ග්‍රාම නාම දෙවැනි උපලේඛනයේ ප්‍රකාර වෙනස් කරන්ට යෙදුන බැව් මෙයින් දන්වමි.

| දිස්ත්‍රික්කය | පළමුවෙනි උපලේඛනය | දෙවැනි උපලේඛනය |
|---|---|---|
| ගාල්ල ... | ඔලිගොඩ ... | මැදගොඩ |
| කුරුණෑගල ... | පිදිවිල්ල ... | පලාපත්වල |

ස්වදේශ ඇමති කාර්යාලය,
කොළඹ 7,
1970 පෙබරවාරි මස 23 වන දින.

වි. දහනායක,
ස්වදේශ කටයුතු ඇමති.

3–1199

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව

### මැතිවරණ කොට්ඨාශය අංක 26—බුලත්සිංහල

257 වැනි අධිකාරය වන, ගම් සභා ආඥාපනතේ 8(1) වෙනි වගන්තිය යටතේ පළාත් පාලන පිළිබඳ ගරු ඇමතිවරයා විසින් පනවන්නට යෙදී ඇති අංක 14,835/7 සහ 1969 ජනවාරි මස 9 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදුන නියෝගය අනුව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරනු ලබන්නේ 1946 (ලංකා පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 10(3) වැනි වගන්තිය යටතේ අංක 14,604 සහ 1965 දෙසැම්බර් මස 31 දිනැති ගැසට් අති විශේෂයේ ප්‍රසිද්ධ කරන්නට යෙදුන දන්වීමේ උපලේඛනයේ ඉහත සඳහන් මැතිවරණ දිස්ත්‍රික්කයේ ''ඒ, බී, සී, ඩී, ජී, ජේ, ඇල්, කියු, ආර්'' යන අක්ෂර දරණ ඡන්ද කොට්ඨාශ සම්බන්ධයෙන් දක්වා ඇති විස්තර වෙනුවට මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර ආදේශ කළයුතු බවය.

මැතිවරණ කායඊාලය,
කච්චේරිය, කළුතර,
1970 පෙබරවාරි මස 23 වැනි දින.

කේ. ඇන්. ඩබ්ලිව්. අබේසේකර,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
අංක 26—බුලත්සිංහල මැතිවරණ කොට්ඨාශය.

### උපලේඛනය

| ඡන්ද කොට්ඨාශය | වෙන්කර ඇති අක්ෂරය හෝ අක්ෂර | ඡන්ද කොට්ඨාශය හෝ කොට්ඨාශ පිහිටුවනු ලබන ප්‍රදේශ |
|---|---|---|
| ගහබඩ පත්තුවේ අංක 819—මහගම උතුර ග්‍රාමසේවක කොට්ඨාශයේ පිහිටි මහගම උතුර (කොටසක්) සහ නාලන්ද වත්ත යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ වෙල්ගම් පළාත ගම් සභාවේ අංක 1—මහගම උතුර (නැගෙනහිර කොට්ඨාශය) සහ මහගම උතුර (කොටසක්) ගමින් යුක්තවූ වෙල්ගම් පළාත ගම් සභාවේ අංක 1ඒ—මහගම උතුර (බටහිර) කොට්ඨාශය ... ... ... ... | ඒ ... | මහගම උතුර |
| ගහබඩ පත්තුවේ අංක 819ඒ—මහගම දකුණ ග්‍රාමසේවක කොට්ඨාශයේ පිහිටි මහගම දකුණ (කොටසක්) ගමගෙ කන්ද වත්ත, තිරිවාන කැටිය (අළුත් කොටස) යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ වෙල්ගම් පළාත ගම් සභාවේ අංක 2—මහගම දකුණ (නැගෙනහිර කොටස) සහ මහගම දකුණ (කොටසක්) ගමින් යුක්තවූ වෙල්ගම් පළාත ගම් සභාවේ අංක 2ඒ—මහගම දකුණ (බටහිර) කොට්ඨාශය ... ... ... ... | බී ... | මහගම දකුණ |
| ගහබඩ පත්තුවේ අංක 824—වෙල්ගම ග්‍රාමසේවක කොට්ඨාශය තුළ පිහිටි ඉහල වෙල්ගම (කොටසක්) කල වැල්ලාව, තැන්නහේන, කුයිල්කාවත්ත, කිනර්ස්ලි වත්ත, වෙල්ගම රබර් වත්ත, කුඩාගහ රබර් වත්ත, තිරිවාන කැටිය වත්ත, වෙල්ගම වතුයාය සහ ජෙසීමා වත්ත යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ වෙල්ගම පළාත ගම් සභාවේ කොට්ඨාශ අංක 3—ඉහල වෙල්ගම සහ ඉහල වෙල්ගම (කොටසක්) පහල වෙල්ගම්, අතුර, මිල්ලකන්ද තේ වත්ත, ටෙම්පෝ වත්ත, හිල් ස්ට්‍රීම් වත්ත, කුඩාගහ තේ වත්ත, ගල්කැටියා වත්ත සහ මිල්ලකන්ද රබර්වත්ත යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ වෙල්ගම් පළාත ගම් සභාවේ අංක 3ඒ—පහල වෙල්ගම කොට්ඨාශය ... ... | සී ... | පහල වෙල්ගම |
| ගහබඩ පත්තුවේ අංක 821—බුලත්සිංහල ග්‍රාමසේවක කොට්ඨාශයේ පිහිටි බුලත්සිංහල උතුර, ඇන්ඩර්සන් වත්ත, මිරි ගී කැලේ වත්ත යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ වෙල්ගම් පළාත ගම් සභාවේ අංක 4—බුලත්සිංහල උතුර සහ බුලත්සිංහල දකුණ, හිල්ක්‍රෆ්ට් ඩිවිෂන් කටුහේන වත්ත, මිරිස්හේන වත්ත, ශාන්ත ප්‍රැන්සිස් වත්ත සහ මිල්ල කන්ද තේ වත්ත (කොටසක්) යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ වෙල්ගම් පළාත ගම් සභාවේ අංක 4ඒ—බුලත්සිංහල දකුණ කොට්ඨාශය ... ... ... ... | ඩී ... | බුලත්සිංහල |
| ගහබඩ පත්තුවේ අංක 822—බෝතලේ ග්‍රාමසේවක කොට්ඨාශයේ පිහිටි දිවලකඩ ගමින් යුක්තවූ වෙල්ගම් පළාත ගම් සභාවේ අංක 7—දිවලකඩ කොට්ඨාශය සහ බෝතලේ ගමින් යුක්තවූ වෙල්ගම් පළාත ගම් සභාවේ අංක7ඒ—බෝතලේ කොට්ඨාශය ... ... ... ... | ජී ... | බෝතලේ |
| ගහබඩ පත්තුවේ අංක 814—ගෝවින්න ග්‍රාමසේවක කොට්ඨාශයේ පිහිටි ගෝවින්න, විලපහල (රැටියල ගමින් කොටසක්), ප්‍රොසෙස්ටර් වත්ත (කොටසක්), ගෝවින්න වත්ත (කොටසක්), යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ වරකගොඩ පළාත ගම් සභාවේ අංක 1—ගෝවින්න කොට්ඨාශය සහ රැටියල (කොටසක්), පින්සින් වත්ත, ප්‍රොසෙස්ටර් වත්ත (කොටසක්) සහ මිරිස්වත්ත (කොටසක්) යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ වරකගොඩ පළාත ගම් සභාවේ අංක 1ඒ—රැටියල කොට්ඨාශය ... ... ... ... | ජේ ... | ගෝවින්න |
| ගහබඩ පත්තුවේ අංක 813—කොබවක ග්‍රාමසේවක කොට්ඨාශයේ පිහිටි ඉහල නාරගල, සහ ඕපල්ල යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ වරකගොඩ පළාත ගම් සභාවේ අංක 3—ඉහල නාරගල කොට්ඨාශය සහ කොබවක, කොබෝවැල්ල වත්ත, ප්‍රොසෙස්ටර් වත්ත (කොටසක්) සහ ගෝවින්න වත්ත (කොටසක්) යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ වරකගොඩ පළාත ගම් සභාවේ අංක 3ඒ—කොබවක කොට්ඨාශය ... ... ... | ඇල් ... | කොබවක |
| ගහබඩ පත්තුවේ අංක 811—කරන්නාගොඩ ග්‍රමසේවක කොට්ඨාශයේ පිහිටි ඉහල කරන්නාගොඩ යන ගමින් යුක්තවූ වරකගොඩ පළාත ගම් සභාවේ අංක 8—ඉහල කරන්නාගොඩ කොට්ඨාශය සහ පහල කරන්නාගොඩ සහ ටෙම්පෝ වත්ත යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ වරකගොඩ පළාත ගම් සභාවේ අංක 8ඒ—පහල කරන්නාගොඩ කොට්ඨාශය ... ... ... ... | කියු ... | ඉහල කරන්නාගොඩ |
| ගහබඩ පත්තුවේ අංක 816—වරකගොඩ ග්‍රාමසේවක කොට්ඨාශයේ පිහිටි වරකගොඩ (බටහිර) යන ගමින් යුක්තවූ වරකගොඩ පළාත ගම්සභාවේ අංක 9—වරකගොඩ බටහිර කොට්ඨාශය සහ වරකගොඩ (නැගෙනහිර), දික්ලන්ද වත්ත, ගිකියන කන්ද නැගෙනහිර සහ බටහිර යන ප්‍රදේශයන්ගෙන් යුක්තවූ වරකගොඩ පළාත ගම් සභාවේ අංක 9ඒ—වරකගොඩ නැගෙනහිර කොට්ඨාශය ... ... ... ... | ආර් ... | වරකගොඩ |

3—1200/1

## 1946 (ලංකා පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව

**මැතිවරණ කොට්ඨාශය අංක 30 — බේරුවල**

257 වැනි අධිකාරය වන, ගම් සභා ආඥාපනතේ 8 (1) වැනි වගන්තිය යටතේ පළාත් පාලනය පිළිබඳ ඇමතිවරයා විසින් පනවන්නට යෙදී ඇති අංක 14,808/3 සහ 1968 ජූනි 30 වැනි දිනැති අතිරේක ගැසට් පත්‍රයේ පළකරන්නට යෙදුනු නියෝගය අනුව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරනු ලබන්නේ 1946 (ලංකා පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 10 (3) වගන්තිය යටතේ අංක 14,604 සහ 1965 දෙසැම්බර් 31 වැනි දිනැති ගැසට් අති විශෙෂයේ ප්‍රසිද්ධ කරන්නට යෙදුන දන්වීමේ උපලේඛනයේ ඉහත සඳහන් මැතිවරණ දිස්ත්‍රික්කයේ ''බීබී'' සහ ''ඇල්ඇල්'' යන අක්ෂර දරණ ඡන්ද කොට්ඨාශ සම්බන්ධයෙන් දක්වා ඇති විස්තර වෙනුවට මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර ආදේශ කළයුතු බව ය.

කේ. ඇන්. ඩබ්ලිව්. අබේසේකර,
සහකාර ලියාපදිංචිකිරීමේ නිලධාරී,
අංක 30—බේරුවල මැතිවරණ කොට්ඨාශය.

1970 පෙබරවාරි මස 23 වැනි දින,
කළුතර මැතිවරණ කායසීලයේ දී ය.

### උපලේඛනය

| ඡන්ද කොට්ඨාශය | වෙන්කර ඇති අක්ෂරය හෝ අක්ෂර | ඡන්ද කොට්ඨාශය හෝ ඡන්ද කොට්ඨාශ පිහිටුවනු ලබන ප්‍රදේශ |
|---|---|---|
| කළුතර තොටමුනේ අංක 770 දරණ කොටපිටිය ග්‍රාමසේවක වසම තුළ පිහිටි කොටපිටිය, දන්වත්තගොඩ, උලගහ ගොඩ, හීන්මුල්ල සහ බජ්ජුගොඩ යන ගම්වලින යුක්ත වූ බේරුවල්-අළුත්ගම්-මාලෙවන් බද්ද ගම් සභාවේ අංක 3 දරණ කොටපිටිය කොට්ඨාශය සහ කුට්ටිවැලිගොඩ, කොස්වත්තගොඩ, නාකන්දලගොඩ සහ මාලේවන යන ගම්වලින් යුක්ත වූ බේරුවල්-අළුත්ගම්-මාලෙවන් බද්ද ගම් සභාවේ අංක 3ඒ දරණ නාකන්දලගොඩ කොට්ඨාශය ... | ''බීබී'' ... | නාකන්දලගොඩ |
| කළුතර තොටමුනේ අංක 750 දරණ වලතර ග්‍රාමසේවක වසම තුළ පිහිටි වලතර, හෙරලත්තුඩුව සහ වනහිංගොඩ යන ගම්වලින් යුක්තවූ බේරුවල්-අළුත්ගම්-මාලෙවන් බද්ද ගම් සභාවේ අංක 14 දරණ වලතර කොට්ඨාශය සහ මංහන්දිය, අකුරැස්ස, බදනගොඩ සහ තොලනිය යන ගම්වලින් යුක්තවූ බේරුවල්-අළුත්ගම්-මාලෙවන් බද්ද ගම් සභාවේ අංක 14ඒ දරණ බදනගොඩ කොට්ඨාශය ... ... ... ... ... | ''ඇල්ඇල්'' ... | වලතර |

3-1200/2

---

# විවිධ දෙපාර්තමේන්තු දන්වීම්

## ලංකාණ්ඩුවේ දුම්රිය සේවය

**දුම්රිය හරස් පාරවල් අලුත්වැඩියා කිරීම**

කැළණි මිටියාවත මාර්ගයේ සැතපුම් 5, දම්වැල් 46 හි නුගේගොඩ පල්ලිය පාර වැටී ඇති ස්ථානයෙහි පිහිටි දුම්රිය හරස් මාර්ගය අලුත්වැඩියා කරනු ලබන හෙයින් 1970. 3. 14 වෙනි සෙනසුරාදා පස්වරු 8 සිට 1970. 3. 15 වෙනි ඉරිදා පෙරවරු 6 දක්වා වැඩ නිමවන තෙක් සම්පූර්ණයෙන් වසා තබනු ලැබේ. ඉන්පසු මෙහි වැඩ සම්පූර්ණයෙන් අවසාන වනතුරු රථවාහන ගමනාගමනයට මේ ස්ථානයෙන් ඉඩ සලසනු ඇත. මෙහි වැඩ කටයුතු කරගෙන යන කාලය තුළදී නුගේගොඩ දුම්රිය ස්ථාන පටු මඟ දිගේ පල්ලිය පාරෙන් ද, පරණ කැස්බෑව පාරේ දුම්රිය හරස් පාරෙන් ද, රථ වාහන ගමන් කරවිය හැකිය.

ජේ. පෝල් සේනාරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

3-1268/1

---

## ලංකාණ්ඩුවේ දුම්රිය සේවය

**දුම්රිය හරස් පාරවල් අලුත්වැඩියා කිරීම**

ගාළු පාරේ සිට රත්මලාන දුම්රිය පළ දක්වා දිවෙන මහා මාර්ගයේ රත්මලාන දුම්රිය කර්මාන්තශාලාවේ අංක 4 දරණ දොරටුව අසළ පිහිටා ඇති දුම්රිය හරස් මග අළුත් කිරීම සඳහා 70.3.14 දින උදේ 7 සිට රාත්‍රි 10 දක්වාත් 70.3.15 දින අළුයම 4 සිට සවස 6 දක්වාත් අර්ධ වශයෙන් වසා මහා මාර්ග වාහන වලට යෑමට අවසර දෙන අතර 70 3.14 දින රාත්‍රි 10 සිට 70.3.15 දින අළුයම 4 දක්වා සම්පූර්ණයෙන්ම වසා තබනු ඇත.

සම්පූර්ණයෙන් වසා තබන කාලය ඇතුලත මහාමාර්ග වාහන වලට රත්මලාන ගාළු පාරේ සිට කල්දෙමුල්ල දක්වා දිවෙන මාර්ගයට සම්බන්ධ වන රත්මලාන දුම්රිය පළ මාර්ගය පාවිච්චි කළ හැක.

ජේ. පෝල් සේනාරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

3-1268/2

---

## ආහාර පාලන නිවේදනයයි

**කොළඹ නාගරික ප්‍රදේශය තුළ 25 වෙනි වාරයේ සහල් සලාක පොත් නිකුත් කිරීම පිළිබඳව ගෘහවාසීන් ගණන් ගැනීම**

25 වෙනි වාරයේ සහල් සලාක පොත් නිකුත් කිරීම පිළිබඳව කොළඹ නාගරික ප්‍රදේශයේ සහකාර ආහාර පාලක තැන විසින් පත් කරන ලද බලය ලත් නිලධාරීන් විසින් පාරිභෝගිකයින්ගේ ගෘහයන් වෙත 1970 මාර්තු මස 1 වෙනි දින සිට මාර්තු මස 21 වෙනි දින දක්වා පෙ. ව. 7 සිට ප. ව. 9 තෙක් ගෘහ මූලික ලැයිස්තු නිකුත් කර නැවත එකතු කරනු ලැබේ.

මෙම බලය ලත් නිලධාරීන්ගෙන් ගෘහ මූලික ලැයිස්තු ලබාගෙන ඒ සමග නිකුත් කර ඇති පත්‍රිකාවේ අඩංගු උපදෙස් පරිදි එම ගෘහ මූලික ලැයිස්තු පැහැදිලිවද, නිවැරදිවද සම්පූර්ණ කර නියමිත දිනදී බලය ලත් නිලධාරීන් වෙත නැවත භාරදෙන මෙන් කොළඹ පදිංචි ගෘහ වාසීන්ගෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙම ගෘහ මූලික ලැයිස්තු නිවැරදිවද, පැහැදිලිවද සම්පූර්ණ කර නියමිත දිනදී ආපසු භාර නොදීමෙන් 25 වෙනි වාරයේ සහල් සලාක පොත් ලබා ගැනීමට ප්‍රමාදවීමත්, දුෂ්කරතාවයන්ට මුහුණදීමත් වැළැක්විය නොහැක.

ටී. ඕ. දේවේන්ද්‍ර,
සහකාර ආහාර පාලක,
(කොළඹ නාගරික ප්‍රදේශය).

17, බාන්ස් පෙදෙස,
තැ. පෙ. 514, කොළඹ 7,
1970 පෙබරවාරි 25 දින.

3-1264

---

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

**වේයන්ගොඩ දිස්ත්‍රික්කය** — **බටහිර කොට්ඨාශය**

### පල්ලේගම-මිතිරිගල-රන්වල පාර

පල්ලේගම-මීතිරිගල-රන්වල පාරේ අංක 4/6 දරණ බෝක්කුව සියලුම රථවාහන ගමනාගමනය සඳහා දැන් විවෘතව ඇති බව මහ ජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. සෙල්වදුරෙයි,
මහාමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1970 පෙබරවාරි මස 25 වැනි දින,
කොළඹ 1,
මහාමාර්ග දෙපාර්තමේන්තුවේදීය.

3-1285

ඇල්.ඩී.—බී 60/34

## රේගු නිවේදනය අංක 2/70

### රේගු ආඥපනත

(235 වැනි අධිකාරය වන) රේගු ආඥපනතේ 69 වැනි වගන්තියෙන් මා වෙත පරවනු ලැබූ බලතල අනුව, ප්‍රධාන රේගු අයකැමි විජය පෙරේරා විට්ටාච්චි වන මම, ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමතිවරයා විසින් දෙන ලද අනුමැතිය ඇතිව ඔහුගේ නියමය පරිදි පළ කරනු ලබන මේ නිවේදනයෙන්,

(අ) කොල්ලුපිටියේ ගාලු පාරේ අංක 363 දරන ස්ථානයේ මෝලෙහි අංක 4 දරණ ගබඩාවේ (36′×19′7″×12′8″ ප්‍රමාණයෙන් යුතු වූ) ගඩොලින් බෙදා වෙන් කළ කොටස සීමාසහිත ෂෝ වොලස් හා හෙජස් මහතුන් විසින් ආනයනය කරනු ලබන සිගරැට් හා (මෝල්ට් මත්පැන් ඇතුළු) මත්පැන් ඒවායේ ප්‍රථම ආනයන බිල් සටහන වෙනුවෙන් තීරු ගාස්තු නොගෙවා ගබඩා කිරීම, තැබීම හා ආරක්ෂා සැලසීම කළ හැකි ගුදමක් වශයෙන් අනුමත කොට නියම කරමි; තවද

(ආ) කොල්ලුපිටියේ ගාලු පාරේ අංක 363 දරන ස්ථානයේ බැඳුනු ගුදම අනුමත කොට නියම කිරීම සම්බන්ධයෙන් 1967 දෙසැම්බර මස 28 වැනි දින අංක 14,681 දරන ගැසට් පත්‍රයේ, එම වගන්තිය යටතේ පළ කරනු ලැබූ අංක 11/67 දරන රේගු නිවේදන බැඳුම්කරය අවලංගු කරමි.

වී. පී. විට්ටාච්චි,
ප්‍රධාන රේගු අයකැමි.

1970 පෙබරවාරි 15 වන දින,
කොළඹ දී ය.

3-1354

---

ඇල්.ඩී.—බී. 60/34

## රේගු නිවේදනය අංක 9/69 දරන බැඳුම්කරය

### රේගු ආඥපනත

(235 වැනි අධිකාරය වන) රේගු ආඥපනතේ 69 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල අනුව, ප්‍රධාන රේගු අයකැමි විජය පෙරේරා විට්ටාච්චි වන මම, ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමතිවරයා විසින් දෙන ලද අනුමැතිය ඇතිව ඔහුගේ නියමය පරිදි පළ කරනු ලබන මේ නිවේදනයෙන්—

(අ) කොළඹ කොටබෝම් වීදියේ අංක 180 දරණ (56′ 7″ × 56′ 4″ × 18′ ප්‍රමාණයෙන් යුතුවූ) සිසිල් කිරීමේ ගබඩාව සීමාසහිත ලංකා දුම්කොළ සමාගම විසින් ආනයනය කරනු ලබන දුම්කොළ, සිගරැට්, සුරුට්ටු හා පයිප්ප දුම්කොළ ඒවායේ ප්‍රථම ආනයන බිල් සටහන වෙනුවෙන් තීරු ගාස්තු නොගෙවා ගබඩා කිරීම, තැබීම හා ආරක්ෂා සැලසීම කළ හැකි ගුදමක් වශයෙන් අනුමත කොට නියම කරමි; තවද,

(ආ) කොළඹ කොටබෝම් වීදියේ අංක 180 දරණ ස්ථානයේ බැඳුනු ගුදම අනුමත කොට නියම කිරීම සම්බන්ධයෙන් 1954 ඔක්තෝබර් 8 වැනි දින අංක 10,723 දරණ ගැසට් පත්‍රයේ, එම වගන්තිය යටතේ පළ කරනු ලැබූ අංක 54 (බී) 7 දරණ රේගු නිවේදන බැඳුම්කරය අවලංගු කරමි.

වී. පී. විට්ටාච්චි,
ප්‍රධාන රේගු අයකැමි.

1970. 2. 11.
කොළඹ දීය.

3-1204

---

## මාර/ශ්‍රී නිකේත පිරිවෙන, කඩවැද්දුව, යටියන

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ පිහිටි ඉහත සඳහන් පිරිවෙන, රජයේ ආධාර ලබන කණිෂ්ඨ පිරිවෙනක් ලෙස 1965.12.6 දින සිට තාවකාලිකව ලියාපදිංචි කළ බව මෙයින් දැනුම් දෙමි.

පී. සෙනරත්,
අධ්‍යාපන අධ්‍යක්ෂ,
මාතර ප්‍රදේශය.

1970 පෙබරවාරි මස 19 දින,
මාතර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ය.

3-1156

---

## 1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධිත (453 වැනි අධිකාරය වන) වාරිමාර්ග ආඥපනත

1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතේ 17 වන වගන්තිය මගින් සංශෝධිත ඉහත සඳහන් ආඥපනතේ 33 වන වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති විසින් සකස් කරන ලද පහත දක්වා ඇති යෝජනා ක්‍රමය ම විසින් අනුමත කරනු ලැබූ බව, ගොවිජන සේවා කොමසාරිස් සෙනෙවිරත්න බණ්ඩා සේනානායක වන මම, 1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතේ 19 වන වගන්තිය මගින් සංශෝධිත (ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥපනතේ 35 වන වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

එස්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

1969. 6. 1.

### සුළු වාරිමාර්ග වැඩ වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ක්‍රමය

1. වැවයේ නම සහ විස්තරය : මැදදුම්බර පිලාමුල්ල දොඩම්ගැටේ අමුණ—ජේ./21 (4.72×7.67.)

2. යෝජනා ක්‍රමය යටතේ ජල සම්පාදන කළ හැකි ඉඩම් ප්‍රමාණය සහ ඒවායේ ස්වභාවය :—

   පෞද්ගලික ඉඩම් : දළ වශයෙන් අක්කර 55 යි.

   රජයේ ඉඩම් : නැත.

3. එකඟවූ කොන්දේසි නම් :—

   (1) අවශ්‍ය වැඩයේ පහත සඳහන් වැඩ කොටස්, එනම්—

   (අ) අමුණ ඉදිකිරීම,

   (ආ) ඇළ ප්‍රතිසංස්කරණය කිරීම.

   (ඇ) කොන්ක්‍රීට් පිහිල්ලක් ඉදිකිරීම (දම්. 9.75).

   (ඈ) දිය බෙදුමක් ඉදිකිරීම (දම්. 22.0).

   ඇස්තමේන්තු කළ වියදම රු. 21,000 දක්වා තැනීම රජය විසින් භාරගන්නා ලදී.

   (2) රජය විසින් ඉහත සඳහන් පරිදි යථෝක්ත වැඩය භාර ගෙන තිබීම සලකා එම වැඩය අවසන් කළායින් පසුව එය නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන සියළුම කම්කරු ශ්‍රමය සියළුම ගාස්තු රහිතව, මෙම කුඹුරුවල කට්ටි ලැබුම්කරුවන් හා අඳ ගොවියන් සහ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් එහි අයිතිකරුවන් විසින් සැපයිය යුතුයි.

   (3) මෙම යෝජනා ක්‍රමය යටතේ නියමිත තම කොටස ඉටු කිරීම යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන්ගෙන් සහ අඳ ගොවීන්ගෙන් යම් කෙනෙක් හෝ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් මෙම ඉඩම්වල අයිතිකරුවන් ගෙන් හෝ ඕනෑම පුද්ගලයෙක් යම්සේ පැහැර හැරියහොත්, ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් යම් වෙනත් පුද්ගලයෙකු ලවා එකී කම්කරු ශ්‍රමය ඉටු කරවා ආඥපනතේ VII වන කොටසේ නියමිත ආකාරයට වියදම් අය කරනු ලැබේ.

3-1197

---

## හ/හල්පන්දෙනිය රතනපාල පිරිවෙන, ඉහළ බෙලිගල්ල, බෙලිඅත්ත

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත මැතිවරණ කොට්ඨාශයේ ඉහළ බෙලිගල්ලේ පිහිටි ඉහත සඳහන් පිරිවෙන රජයේ ආධාර ලබන පිරිවෙනක් ලෙස 1968. 1. 1 දින සිට තාවකාලික වශයෙන් ලියාපදිංචි කළ බව මෙයින් දන්වමි.

ඩී. අරම්පත්ත,
ප්‍රධාන අධ්‍යාපන නිලධාරි, තංගල්ල,
මාතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂක වෙනුවට.

මගේ අංකය : හ/6/99
වර්ෂ 1970 ක්වූ පෙබරවාරි මස 22 වන දින,
තංගල්ල අධ්‍යාපන කාර්යාලයේදීය.

3-1234

## කෑගල්ල දිස්ත්‍රික්කයේ පරනකුරු කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ග්‍රාමසේවක කොට්ඨාශ ප්‍රතිසංස්කරණය කිරීම

1970 මාර්තු මස 15 වැනි දින සිට කෑගල්ල පාලන දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයෙහි අංක 51 දරණ සියඹලාපිටිය ග්‍රාමසේවක කොට්ඨාශය සියඹලාපිටිය වසම හා කෑගල්ල නගර සභා කොට්ඨාශය යනුවෙන් ග්‍රාමසේවක කොට්ඨාශ දෙකකට බෙදා ඇති බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) පහත සඳහන් ගම් අංක 51 දරණ සියඹලාපිටිය ග්‍රාම සේවක කොට්ඨාශයට ඇතුළත් වේ :—

(1) සියඹලාපිටිය,
(2) වැවලදෙනිය (නගර සභාවෙන් පිට),
(3) ඔලගම (නගර සභාවෙන් පිට),
(4) ගන්ගොඩ (නගර සභාවෙන් පිට),
(5) මිරිහැල්ල (නගර සභාවෙන් පිට),
(6) පුස්සැල්ල (නගර සභාවෙන් පිට),
(7) ඔලගම ජනපදය (නගර සභාවෙන් පිට),
(8) කුරුකොහොතැන්න,
(9) තලගහයාය,
(10) රොසසිට්වත්ත (කොටසක්).

(ආ) පහත සඳහන් ගම් අංක 51ඒ දරණ කෑගල්ල නගරසභා කොට්ඨාශය ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ :—

(1) කෑගල්ල,
(2) අඹන්පිටිය,
(3) රන්වල,
(4) වැවලදෙනිය (කොටසක්),
(5) ඔලගම (කොටසක්),
(6) ගන්ගොඩ (කොටසක්),
(7) පානකාව (කොටසක්),
(8) මිරිහැල්ල (කොටසක්),
(9) මාදෙසියාව (කොටසක්),
(10) මීපිටිය (කොටසක්),
(11) වල්දෙනිය (කොටසක්),
(12) නිල්වක්ක (කොටසක්),
(13) පිටිහුම,
(14) ගොලහැල,
(15) අඟුරුවැල්ල,
(16) රද්දල,
(17) කනටපිටිය,
(18) බෝහර,
(19) පහලගම,
(20) පල්ලාදෙණිය,
(21) වැලිමන්නාතොට,
(22) නාන්දිවල.

2. මෙම ග්‍රාමසේවක කොට්ඨාශ අයත්වන මහෙස්ත්‍රාත් උසාවිය, ගම්බද උසාවිය, පොලිස් වසම, උප්පැන්න මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, පළාත් පාලන ආයතනයන් සහ මැතිවරණ දිස්ත්‍රික්කය සෑම දෙනාගේම දැනගැනීම සඳහා මෙහි පහත දක්වමි :—

(1) අයත්වන මහේස්ත්‍රාත් උසාවිය : කෑගල්ල මහේස්ත්‍රාත් උසාවිය ;

(2) අයත්වන ගම්බද උසාවිය :

(අ) සියඹලාපිටිය වසම—හෙට්ටිමුල්ල ගම්බද උසාවිය.

(ආ) කෑගල්ල නගරය වසම—හෙට්ටිමුල්ල, බටුවත්ත සහ පින්නවල ගම්බද උසාවි.

(3) පොලිස් වසම : කෑගල්ල.

(4) උප්පැන්න, මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය : පරණ කෝරළය.

(5) විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය : පරණකුරු කෝරළය.

(6) පළාත් පාලන ආයතනය :

(අ) සියඹලාපිටිය වසම—මාවතපත්තු ගම්කාර්ය සභාව.
(ආ) කෑගල්ල නගරය වසම—කෑගලු නගර සභාව.

(7) මැතිවරණ දිස්ත්‍රික්කය :

(අ) සියඹලාපිටිය වසම—කෑගල්ල 132.
(ආ) කෑගල්ල නගරය වසම—කෑගල්ල 132—ගලිගමුව 131.

ඇස්. මාරලන්ද,
කෑගල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 පෙබරවාරි මස 22 වැනි දින,
කෑගල්ලේ දිසාපති කාර්යාලයේ දී ය.

3-1152

## නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ආදායම් නිලධාරී කොට්ඨාශයේ ග්‍රාමසේවක කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ අංක 533 දරණ රාගල, අංක 528 දරණ රුපහ, අංක 531 දරණ අඹලියද්ද යන ග්‍රාමසේවක කොට්ඨාශ තුන අංක 533 දරණ රාගල, අංක 528 දරණ රුපහ, අංක 531 දරණ අඹලියද්ද හා අංක 533 (අ) දරණ උඩ පුස්සැල්ලාව යන ග්‍රාමසේවක කොට්ඨාශ හතරකට බෙදා වෙන් කරමින් අංක 14,856 හා 1969.5.30 වැනි දිනැති ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනයට පහත දක්වෙන සංශෝධන අඩංගු කල බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

(අ) අංක 533 දරණ රාගල ග්‍රාමසේවක කොට්ඨාශය යටතේ සඳහන් වෙන පහත දැක්වෙන වතු දෙක එම කොට්ඨාශයෙන් ඉවත් කරමි.

11—එක්ස්ඩේල් වත්ත.

19—හෙදර්සෙට් වත්ත.

(ආ) අංක 533 දරණ රාගල ග්‍රාමසේවක කොට්ඨාශය යටතේ සඳහන් කර ඇති ගම් සහ වතු විසිඑකට අමතරව පහත සඳහන් වතු ද ඇතුලත් කරමි.

22—බෑක්සයිඩ් වත්ත.

23—රාගල වත්ත.

24—සැන්ට් ලෙනාඩ්ස් වත්ත.

පී. ඇම්. විජේකෝන්,
නුවරඑළිය දිසාපති.

1970 ජනවාරි මස 29 වන දින,
නුවරඑළිය දිසාපති කාර්යාලයේ දීය.

3-1153

---

## 1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධන (453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනත

1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 17 වන වගන්තිය මගින් සංශෝධිත ඉහත සඳහන් ආඥා පනතේ 33 වන වගන්තිය යටතේ මහනුවර ආණ්ඩුවේ දිසාපති විසින් සකස කරන ලද පහත දක්වා ඇති යෝජනා ක්‍රමය ම විසින් අනුමත කරනු ලැබූ බව, ගොවිජන සේවා කොමසාරිස් සෙනෙවිරත්න බණ්ඩා සේනානායක වන මම, 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 19 වන වගන්තිය මගින් සංශෝධිත (ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනතේ 35 වන වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

එස්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

දිනය :—1969.6.1.

### සුළු වාරිමාර්ග වැඩ වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ක්‍රමය

1. වැඩයේ නම සහ විස්තරය :—ගන තොරුව මැද ඇල අයි/25 (4.10 × 6.55).

2. යෝජනා ක්‍රමය යටතේ ජල සම්පාදනය කළහැකි ඉඩම් ප්‍රමාණය සහ ඒවායේ ස්වභාවය :—

පෞද්ගලික ඉඩම් :—දල වශයෙන් අක්කර 57 යි.

රජයේ ඉඩම් :—

3. එකඟවූ කොන්දේසි නම් :—

(1) අවශ්‍ය වැඩයේ පහත සඳහන් වැඩ කොටස්,

එනම් :—අඩි 7380 ක් ඇල කණ්ඩිය ප්‍රකෘතිමත් කිරීම.
කණ්ඩියේ දුර්වල තැන්වල සක්ක ගල් බැමි බැඳීම.

ඇස්තමේන්තු කළ වියදම රු. 40,000.00 දක්වා තැනීම රජය විසින් භාරගන්නා ලදී.

(2) රජය විසින් ඉහත සඳහන් පරිදි යථෝක්ත වැඩය භාරගෙන තිබීම සලකා එම වැඩය අවසන් කළායින් පසුව එය නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන සියළුම කම්කරු ශ්‍රමය සියළුම ගාස්තු රහිතව, මෙම කුඹුරුවල කට්ටි ලැබුම්කරුවන් හා අඳ ගොවියන් සහ යම් කුඹුරක කට්ටි ලැබුම් කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් එහි අයිතිකරුවන් විසින් සැපයිය යුතුයි.

(3) මෙම යෝජනා ක්‍රමය යටතේ නියමිත තම කොටස ඉටු කිරීම යම් කුඹුරක කට්ටි ලැබුම් කරුවන්ගෙන් සහ අඳ ගොවීන්ගෙන් යම් කෙනෙක් හෝ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් මෙම ඉඩම්වල අයිතිකරුවන්ගෙන් හෝ ඕනෑම පුද්ගලයෙක් යම්සේ පැහැර හැරියහොත්, ආණ්ඩුවේ දිසාපති වරයා විසින් යම් වෙනත් පුද්ගලයෙකු ලවා එකී කම්කරු ශ්‍රමය ඉටු කරවා ආඥපනතේ VII වන කොටසේ නියමිත ආකාරයට වියදම් අය කරනු ලැබේ.

3-1164

---

මගේ අංකය : නීති/ණ/111.

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

**උකස් කරනු ලැබූ ඉඩම්, ජාතික නිවාස ආඥපනතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 401 වැනි පරිච්ඡෙදය) අංක 76 දරණ වගන්තිය යටතේ හා 1966 අංක 36 දරණ (සංශෝධිත) පනත යටතේ විකිණීම සඳහා බලය දීම**

ජාතික නිවාස ආඥපනතේ අංක 9(1)බී දරණ වගන්තිය යටතේ සහ එයට අදාල සංශෝධන පනත් යටතේ පත් කරනු ලැබූ, ජාතික නිවාස සහකාර කොමසාරිස් ධනපාල සිරිසේන වීරසිංහ වන මම, ලංකාණ්ඩුව සඳහාත් වෙනුවෙනුත් ක්‍රියාකරමින් කුරුණෑගල, ආර්. ඊ. ද එස්. ජයසුන්දර ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1956. 5. 10 දින අංක 3184 දරණ උකස්කරය යටතේ මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින්, ඩබ්. ඩබ්. ප්‍රේමරත්න මහතා ගෙන් 1969. 8. 10 දින තෙක් අයවිය යුතු රුපියල් හතලිස් තුන්දාස් එකසිය එකයි ශත අනූපහ (43,101.95) 69. 5. 28 දිනට පසු ගෙවන ලද රු. 1,300 හැර අයකර ගැනීම සඳහාත්, එසේම 69.8.10 දින සිට විකිණීම පැවැත්වෙන දිනය හෝ සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා තවදුරටත් වූ රුපියල් දහතුන්දහස්හාරසිය හැත්තෑවයි ශත විසිනවය (රු. 13,470.29) ක මුදලක් සම්බන්ධයෙන් වන පොලී මුදල, වර්ෂයකට සියයට හතර (4%) ප්‍රමාණයට යථෝක්ත උකස්කරය ප්‍රකාර 69. 8. 10 දින සිට විකිණීමේ දිනය තෙක් එකතු වන සියලුම දඩ මුදල් සමඟ අයකර ගැනීමත්, එසේ අයකර ගැනීමේදී දැරීමට සිදුවන වියදම් සහ ගාස්තු අයකර ගැනීම සඳහාත්, මීට අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති ඉඩම සහ එයට අදාල සියළු දේත්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිණිස ආඥා නිකුත් කර, එසේ විකිණීම සඳහා කුරුණෑගල පැරකුම්බා වීදියේ අංක 8 හි එෆ්. වැන්ඩර් පොර්ටන් ප්‍රසිද්ධ වෙන්දේසි කරුට බලය දෙමි.

ධනපාල වීරසිංහ,
ජාතික නිවාස සහකාර කොමසාරිස්.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවත,
කොළඹ 2,
1970. 2. 24.

### උපලේඛනය

වයඹ පලාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ විල්ලි හත්පත්තුවේ, තිරගන්දහේ කෝරලේ, කුරුණෑගල නාගරික සීමාව තුල බටහිර වට රවුමේ පාරේ වරිපණම් අංක 78 දරණ බටහිර වට රවුම් පාරේ පිහිටි ජී. ඒ. ද සිල්වා බලය ලත් මිණින්දෝරු තැන විසින් සකසන ලද අංක 5241 හා 1950.11.28 දින දරණ සැලැස්මේ සඳහන් පර්චස් දහනවයක (අක්. 0, රූ. 0, පර්. 19 ප්‍රමාණයෙන් යුත් ඊසානින් අදොන්චිහාමිගේ සහ මුදියන්සේ ආරච්චිගේ දේපොලින්ද, ගිනිකොනින් පෙරකී සැලැස්මේ "බී" දරණ කැබැල්ලෙන් සහ නිරිතෙන් බටහිර වටරවුම් පාරෙන්ද මායිම්වූ අංක ඒ 586/215 යටතේ ලියා පදිංචි "ඒ" අක්ෂරය දරණ ත්‍රිකෝනාකාර ඉඩම් කැබැල්ල, එහි තනා ඇති නිවාසය, වැව්ල්ල සහ සියළුදේ.

ඉහත කී අංක 5241 දරණ සැලැස්මේ සඳහන් මෙම ත්‍රිකෝනාකාර කොටස පහත නම් සඳහන් යාව පිහිටි කොටස්වලින් බෙදා වෙන් කරන ලද කොටසකි :—

(අ) හිටිනවත්ත නමැති ඉඩමේ බෙදා වෙන් කරන ලද අඩ කොටස, ගම්බිරිගහවත්ත නමැති ඉඩම, බිලින්චගහමුල වත්ත නමැති ඉඩමේ බෙදූ අඩ කොටස, මීගහමුලවත්ත නැමැති ඉඩම සහ පතිනිහාමි හිටියවත්ත නමැති ඉඩමේ බෙදූ තුනෙන් දෙපංගුව සහ ඊට යාබද පිටිය, මේවා එක කොටසක් ලෙස සෑදී ඇත.

(ආ) හිටින වත්තේ නැගෙනහිර කොටස.

(ඇ) මූන්වත්ත නොහොත් මීගහමුලවත්ත නමැති වත්ත.

(ඈ) අඹගහකුඹුර.

(ඉ) හිටිනගෙදරවත්ත නොහොත් කොස්රුප්පවත්ත.

(ඊ) දිවුල්ගහමුලවත්ත සහ

(උ) ගන්සුරියගහමුලවත්ත නොහොත් සුරියගහමුලවත්ත එක් ඉඩමක් සේ සෑදී ඇති මෙම කොටස් අංක ඒ 582/212 යටතේ ලියා පදිංචිවී ඇත.

3-1278.

## නිවේදනයයි

**1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධිත (453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥපනත**

1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතේ 17 වන වගන්තිය මගින් සංශෝධිත ඉහත සඳහන් ආඥපනතේ 33 වන වගන්තිය යටතේ මහනුවර ආණ්ඩුවේ දිසාපති විසින් සකස් කරන ලද පහත දක්වා ඇති යෝජනා ක්‍රමය මවිසින් අනුමත කරනු ලැබූ බව, ගොවිජන සේවා කොමසාරිස් සෙනෙවිරත්න බණ්ඩා සේනානායක වන මම, 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 19 වන වගන්තිය මගින් සංශෝධිත (ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥපනතේ 35 වන වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

එස්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

1970.1.17.

**සුළු වාරිමාර්ග වැඩ වැඩි දියුණු කිරීම සඳහා යෝජනා ක්‍රමය**

1. වැඩයේ නම සහ විස්තරය : අටබාගේ අමුණ ව්‍යාපාරය—ඇල දිගු කිරීම හැ. 1, දු. 28.85 සිට.

2. යෝජනා ක්‍රමය යටතේ ජල සම්පාදනය කළහැකි ඉඩම් ප්‍රමාණය සහ ඒවායේ ස්වභාවය :—

පෞද්ගලික ඉඩම් : නැත.

රජයේ ඉඩම් : දල වශයෙන් අක්කර 40 යි.

3. එකඟවූ කොන්දේසි නම් :—

(1) අවශ්‍ය වැඩයේ පහත සඳහන් වැඩ කොටස්,

එනම් : 1. ආරක්ෂක බැම් බැඳීම.
2. නිර්මානයන් ඉදිකිරීම.

ඇස්තමේන්තු කළ වියදම රු. 10,000 දක්වා තැනීම රජය විසින් භාරගන්නා ලදී.

(2) රජය විසින් ඉහත සඳහන් පරිදි යථෝක්ත වැඩය භාර ගෙන තිබීම සලකා එම වැඩය අවසන් කළායින් පසුව එය නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන සියළුම කම්කරු ශ්‍රමය සියළුම ගාස්තු රහිතව, මෙම කුඹුරුවල කට්ටි ලැබුම්කරුවන් හා අඳ ගොවියන් සහ යම් කුඹුරක කට්ටි ලැබුම් කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් එහි අයිතිකරුවන් විසින් සැපයිය යුතුයි.

(3) මෙම යෝජනා ක්‍රමය යටතේ නියමිත තම කොටස ඉටු කිරීම යම් කුඹුරක කට්ටි ලැබුම් කරුවන්ගෙන් සහ අඳ ගොවීන්ගෙන් යම් කෙනෙක් හෝ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් මෙම ඉඩම්වල අයිතිකරුවන්ගෙන් හෝ ඕනෑම පුද්ගලයෙක් යම්සේ පැහැර හැරියහොත්, ආණ්ඩුවේ දිසාපති වරයා විසින් යම් වෙනත් පුද්ගලයෙකු ලවා එකී කම්කරු ශ්‍රමය ඉටු කරවා ආඥපනතේ VII වන කොටසේ නියමිත ආකාරයට වියදම් අය කරනු ලැබේ.

3-1277

---

## සමාගම් ආඥාපනත (145 වැනි අධිකාරය)

277 (3) වගන්තිය යටතේ සුන්දර ලංකා පිල්ම්ස් ලිමිටඩ් නම කපාහැරීමේ දැන්වීම, සමාගම් ආඥපනතේ (145 අධිකාරය) විධිවිධාන යටතේ 1965.7.28 දින සංස්ථාපිත සමාගමක් වන සුන්දර ලංකා පිල්ම්ස් ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, සුන්දර ලංකා පිල්ම්ස් ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ට්‍රයෙන් කපා හරින බවත්, සමාගම් විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් ජයරත්නම් පිලික්ස් පොන්නම්බලම් වන මම, සමාගම් ආඥපනතේ (145 අධිකාරය) 277 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ජේ. එෆ්. පොන්නම්බලම්,
සමාගම් රෙජිස්ට්‍රාර්.

1970 පෙබරවාරි මස 18 දින,
කොළඹ, සමාගම් රෙජිස්ට්‍රාර්ගේ
දෙපාර්තමේන්තුවේදීය.

3-1163

## කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ග්‍රාමසේවක කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

1970 මාර්තු මස 15 වැනි දින සිට කළුතර පාලන දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයෙහි අංක 650 දරණ රෙමුණ ග්‍රාමසේවක කොට්ඨාශය 650—රෙමුණ සහ 650 ඒ—බැල්ලපිටිය යනුවෙන් ග්‍රාමසේවක කොට්ඨාශ දෙකකට බෙද ඇති බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) පහත සඳහන් ගම් අංක 650 රෙමුණ ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ :—

රෙමුණ

(ආ) පහත සඳහන් ගම් අංක 650 ඒ බැල්ලපිටිය ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ :—

බැල්ලපිටිය, මාහේන දකුණ.

2. මෙම ග්‍රාම සේවක කොට්ඨාශ අයත් වන මහේස්ත්‍රාත් උසාවිය, ගම්බද උසාවිය, පොලිස් වසම, උප්පැන්න, මරණ හා විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, පළාත් පාලන ආයතනයන් සහ මැතිවරණ දිස්ත්‍රික්කය සැම දෙනාගේම දැනගැනීම සඳහා මෙහි පහත දක්වේ :—

| ග්‍රාම සේවක කොට්ඨාශය | මහේස්ත්‍රාත් උසාවිය | ගම්බද උසාවිය | පොලිස් වසම | උප්පැන්න, මරණ හා විවාහ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය | පළාත් පාලන ආයතනය | මැතිවරණ දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|---|---|
| 1. අංක 650 රෙමුණ ... | හොරන ... | හොරන ... | අගුරුවාතොට ... | බැල්ලපිටිය ... | මුංවත්තබාගේ නැගෙනහිර ගම්සභාව ... | බුලත්සිංහල |
| 2. අංක 650 ඒ බැල්ලපිටිය ... | හොරන ... | හොරන ... | හොරන ... | බැල්ලපිටිය ... | මුංවත්තබාගේ නැගෙනහිර ගම්සභාව ... | බුලත්සිංහල |

ලීල් ගුණසේකර,
කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 පෙබරවාරි මස 20 වැනි දින,
කළුතර කච්චේරියේ දී ය.

3—1154

---

## කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ග්‍රාම සේවක කොට්ඨාශය/කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

1970 මාර්තු මස 15 දින සිට කොළඹ පාලනය දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ අංක 526 දරණ ගංගොඩවිල ග්‍රාම සේවක කොට්ඨාශය, අංක 526 ගංගොඩවිල උතුර ග්‍රාම සේවක කොට්ඨාශය හා අංක 526 ඒ ගංගොඩවිල දකුණ යනුවෙන් ග්‍රාම සේවක කොට්ඨාශ දෙකකට බෙද ඇති බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) පහත සඳහන් ගම් අංක 526 ගංගොඩවිල උතුර ග්‍රාම සේවක කොට්ඨාශයට ඇතුලත් වේ :—

කෝට්ටේ නගර සභාවේ අංක 9 දරණ කොට්ඨාශයට අයත්—

1. පරණ කැස්බෑව පාරේ ඉරට්ටේ අංක දෙල්කඳ හන්දිය දක්වා
2. ජම්බුගස්මුල්ල පාර
3. දිල්කුෂි පෙදෙස
4. සුභද්‍රාරාම පාර
5. සුභද්‍රාරාම පටු මග
6. පරණ කැස්බෑව පාරේ 1 වන පටු මග
7. සුභද්‍රාරාම පාරේ 1 හා II වන පටු මං සමග
8. හයිලෙවල් පාරේ 206 සිට 436/16 දක්වා ඉරට්ටේ වරිපනම් අංක ද
9. හයිලෙවල් පාරේ 239 සිට 463 දක්වා වූ ඔත්තේ වරිපනම් අංක ද

මහරගම සුළු නගර සභාවේ අංක 1 දරණ ඡන්ද කොට්ඨාශයට අයත්—

1. ජම්බුගස්මුල්ල මාවත 1 වැනි පටු මග
2. ජම්බුගස්මුල්ල මාවත 2 වැනි පටු මග
3. ජම්බුගස්මුල්ල මාවත 3 වැනි පටු මග
4. ජම්බුගස්මුල්ල මාවත 4 වැනි පටු මග
5. ජම්බුගස්මුල්ල මාවත 5 වැනි පටු මග
6. ජම්බුගස්මුල්ල මාවත 6 වැනි පටු මග
7. ජම්බුගස්මුල්ල මාවත 7 වැනි පටු මග
8. ජම්බුගස්මුල්ල මාවත 8 වැනි පටු මග
9. ජම්බුගස්මුල්ල මාවත 9 වැනි පටු මග
10. වැකන්ද පටුමග
11. පැපිලියාන පාර
12. වලව්වත්ත පාර
13. උද්‍යාන මාවත
14. පරණ කැස්බෑව පාරේ අංක 8 සිට ඇති ඉරට්ටේ වරිපනම් අංක දෙල්කඳ හන්දිය දක්වා මෙම කොට්ඨාශයට මායිම් වනුයේ පරණ කැස්බෑව පාරෙන් බටහිරට ඇති පෙදෙසය.

(ආ) පහත සඳහන් ගම් අංක 526ඒ ගංගොඩවිල දකුණ ග්‍රාම සේවක කොට්ඨාශයට ඇතුලත් වේ :—

කෝට්ටේ පළාත් ආණ්ඩු සභාවේ අංක 9 ඡන්ද කොට්ඨාශයට අයත්—

1. වැපල් පාර
2. වැපල් පටු මග
3. මිරිහාන පාරේ ඔත්තේ වරිපනම් අංකද

4. කෝට්ටේ අංක 10 ඡන්ද කොට්ඨාශයට අයත්—

1. විමලවත්ත පාර
2. ඇලෝතියාව පාර
3. සමගි මාවත
4. එදිරිසිංහ පාර
5. පැගිරිවත්ත පාර
6. පැගිරිවත්ත 1 වන පටු මග
7. උඩහමුල්ල දුම්රිය පල පාර
8. උඩහමුල්ල දුම්රිය පල පාරේ I වන පටු මග
9. උඩහමුල්ල දුම්රිය පල පාරේ II වන පටු මග
10. පරණ කැස්බෑව පාරේ ඔත්තේ වරිපනම් අංක දෙල්කඳ හන්දිය දක්වා
11. විජයාරාම පාර
12. විජයාරාම පාර පටු මග
13. කනත්ත පාර
14. සංතානම්පිටිය පාර
15. කොට්ටාව පටු මග
16. ජොස්වෙල් පෙදෙස
17. පැගිරිවත්ත 3 වන පටු මග
18. කොට්ටාව පාරේ වරිපනම් අංක 160 සිට 202 දක්වා
19. හයිලෙවල් පාරේ වරිපනම් අංක ඔත්තේ 471 හා ඉරට්ටේ 454 න් ඉහලට

මහරගම සුළු නගර සභාවේ අංක 2 කොට්ඨාශයේ—

1. කැස්බෑව පාරේ ඔත්තේ අංක
2. රබර් වත්ත පාර
3. වනාත පාර 1, 2, 3 යන පටුමගවල්
4. මීගහවත්ත පාර
5. අඹගහවත්ත යාර
6. ශ්‍රී සෝරත මාවත
7. ගල්හේන පාර
8. පාසැල් මාවත

මෙම ග්‍රාමසේවක කොට්ඨාශය අයත්වන මහෙස්ත්‍රාත් උසාවිය, ගම්සභා උසාවිය පොලිස්වසමට, උප්පැන්න මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, පළාත් පාලන ආයතනයන් සහ මැතිවරණ දිස්ත්‍රික්කය සෑම දෙනාගේම දැන ගැනීම සඳහා මෙහි පහත දක්වමි :—

| ග්‍රාම සේවක කොට්ඨාශය | මහෙස්ත්‍රාත් උසාවිය | ගම්බද උසාවිය | උප්පැන්න මරණ හා විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය | පළාත් පාලන ආයතනය | මැතිවරණ දිස්ත්‍රික්කය | පොලිස් වසම |
|---|---|---|---|---|---|---|
| 1. 526 ගංගොඩවිල උතුර ... | දකුණු කොළඹ ගල්කිස්ස | ගංගොඩවිල | 1. කෝට්ටේ නගර සභා පෙදෙසට කෝට්ටේ<br>2. මහරගම සුළු නගර සභා පෙදෙසට බොරලැස්ගමුව | කෝට්ටේ නගර සභාව හා මහර ගම සුළු නගර සභාව | කෝට්ටේ 18 | මිරිහාන නුගේ ගොඩ සහ කොහුවල |
| 2. 526 ඒ ගංගොඩවිල දකුණ | දකුණු කොළඹ ගල්කිස්ස | ගංගොඩවිල | 1. කෝට්ටේ නගර සභා පෙදෙසට කෝට්ටේද ද<br>2. මහරගම සුළු නගර සභා පෙදෙසට බොරලැස්ගමුව | කෝට්ටේ නගර සභාව හා මහර ගම සුළු නගර සභාව | කෝට්ටේ 18 | මිරිහාන හා ගංගොඩවිල |

1970 පෙබරවාරි මස 23 දින,
කොළඹ කච්චේරියේදිය.

ඩී. උමගිලිය,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

3–1205

---

## මහනුවර දිස්ත්‍රික්කයේ පාතහේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ ග්‍රාමසේවක කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

1970 මාර්තු මස 15 දින සිට මහනුවර පාලන දිස්ත්‍රික්කයේ පාතහේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ අංක 280 උඩුදෙනිය සහ අංක 280 ඒ දන්ගමුව ග්‍රාමසේවක කොට්ඨාශ දෙක පහත සඳහන් ලෙස අංක 280 උඩුදෙනිය සහ අංක 280 ඒ උනුවින්න යනුවෙන්, කොට්ඨාශ දෙකක් ලෙස නැවත සකස් කර ඇති බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) පහත සඳහන් ගම් අංක 280 දරණ උඩුදෙනිය ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ:—

(1) උඩුදෙනිය මඩිගේ
(2) උඩුදෙනිය සිංහල ගම
(3) ගලගොඩ
(4) දන්ගමුව

(ආ) පහත සඳහන් ගම් අංක 280 ඒ උනුවින්න ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ:—

(1) උනුවින්න
(2) පල්ලේමාඩිය
(3) මූනමලේ

2. මෙම ග්‍රාමසේවක කොට්ඨාශයට අයත්වන මහෙස්ත්‍රාත් උසාවිය, ගම්බද උසාවිය, පොලිස් කොට්ඨාශය, උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, පළාත් පාලන ආයතනයන් සහ මැතිවරණ දිස්ත්‍රික්කය සැම දෙනාගේම දැනගැනීම සඳහා මෙහි පහත දක්වමි:—

| ග්‍රාම සේවක කොට්ඨාශය | පොලිස් කොට්ඨාශය | මහෙස්ත්‍රාත් උසාවිය | ගම්බද උසාවිය | උප්පැන්න මරණ හා විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය | පළාත් පාලන ආයතනය | මැතිවරණ දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|---|---|
| 280, උඩුදෙනිය ... | තලාතුඔය ... | මහනුවර ... | තලාතුඔය ... | හේවාවිස්ස කෝරලේ ... | හේවාවිස්ස කෝරලේ ... | හේවාහැට |
| 80 ඒ, උනුවින්න ... | තලාතුඔය ... | මහනුවර ... | තලාතුඔය ... | හේවාවිස්ස කෝරලේ ... | හේවාවිස්ස කෝරලේ ... | හේවාහැට |

ආනන්ද මාදෙන,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත
(අතිරේක).

1970 ජනවාරි 3 දින,
මහනුවර කච්චේරියේ දී ය.

3-1198

---

## යාපනය දිස්ත්‍රික්කයේ කරවච්චි ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ ග්‍රාමසේවක කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

1970 මාර්තු මස 15 දින සිට යාපනය පාලන දිස්ත්‍රික්කයේ කරවච්චි ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයෙහි රාමනාදපුරම් ග්‍රාමසේවක කොට්ඨාශය රාමනාදපුරම් හා වඩ්ඩකච්චි යනුවෙන් ග්‍රාමසේවක කොට්ඨාශ දෙකකට බෙදා ඇති බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) පහත සඳහන් ජනපද/ගම්/අංක 167ඒ දරණ වඩ්ඩකච්චි ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ :—

(1) වඩ්ඩකච්චි ජනපදය,

(2) වඩ්ඩකච්චි උගත් තරුණ ව්‍යාපාරය,

(3) වඩ්ඩකච්චි පැරණි ග්‍රාමය සහ පරන්තන්–මුලතිවු පාරේ 7 වැනි සැතපුම් කණුවේ සිට රාමනාදපුරම් දක්වා පැරණි මහනුවර පාරේ බටහිර වඩ්ඩකච්චි ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරයෙන් කොටසක්.

(ආ) පහත සඳහන් ගම් අංක 167 දරණ රාමනාදපුරම් ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ :—

(1) රාමනාදපුරම් ජනපදය,

(2) කල්මාඩුනගර් (ම.ප.ජ. ව්‍යාපාරය),

(3) වඩ්ඩකච්චි ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය (කොටසක්).

2. මෙම ග්‍රාමසේවක කොට්ඨාශ අයත්වන මහේස්ත්‍රාත් උසාවිය, ගම්සභා උසාවිය, පොලිස් වසම, උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, පළාත් පාලන ආයතනයන් සහ මැතිවරණ දිස්ත්‍රික්කය සැම දෙනාගේම දැනගැනීම සඳහා මෙහි පහත දක්වමි :—

| ග්‍රාමසේවක කොට්ඨාශය | මහේස්ත්‍රාත් උසාවි | ගම්බද උසාවිය | උප්පැන්න, මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය | විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය | පළාත් පාලන ආයතනය | මැතිවරණ දිස්ත්‍රික්කය | පොලිස් වසම |
|---|---|---|---|---|---|---|---|
| 1. වඩ්ඩකච්චි ... | කිලිනොච්චිය ... | කිලිනොච්චිය ... | කන්ඩාවලෙයි ... | කරච්චි ... | කරච්චි ග.කා.ස. ... | කිලිනොච්චිය ... | කිලිනොච්චිය |
| 2. රාමනාදපුරම් ... | කිලිනොච්චිය ... | කිලිනොච්චිය ... | කන්ඩාවලෙයි ... | කරච්චි ... | කරච්චි ග.කා.ස. ... | කිලිනොච්චිය ... | කිලිනොච්චිය |

එෆ්. සී. පීටර්ස්,
යාපනය දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970.2.25 වෙනි දින,
යාපනය කච්චේරියේ දීය.

3-1331

---

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

### වාහන ගමනාගමනයට බාධා

වයඹ කොට්ඨාශය. කුලියාපිටිය දිස්ත්‍රික්කය.

### මාහරගම-අලව්ව පාර

මාහරගම-අලව්ව පාර අංක 3/6 දරණ පාලම අලුත් වැඩියා කිරීම සඳහා 1970. 2. 22 දින සිට 1970. 3. 1 දින දක්වා එක් සතියක් තුල සියලුම රථවාහන සඳහා මෙම මාර්ගය වසා තබන බව මහජනයා ගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරනු ලැබේ.

විකල්ප මාර්ගය වශයෙන් අලව්ව-දම්පැලැස්ස පාර ප්‍රයෝජනයට ගත හැක.

ඇස්. සෙල්ලදොරේ,
මහා මාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

3-1181

---

## රථ වාහන ගමනාගමනයට බාධා

### දකුණු පළාත, මාතර දිස්ත්‍රික්කය

ගොඩගම—සුල්තානාගොඩ මාර්ගයේ අංක 2/2 දරණ පාලම

ඉහත සඳහන් පාලම නැවත දන්වනතුරු වසා තබන බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

රථ වාහන ගමනාගමනය සඳහා විකල්ප ගමන් මාර්ග පහත සඳහන් පරිදි වේ :—

(1) මාතර-අකුරැස්ස මාර්ගය.
(2) කොටවිල-කිරිමැටිමුල්ල මාර්ගය.

ඇස්. සෙල්වදොරේ,
මහා මාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

මහා මාර්ග දෙපාර්තමේන්තුව,
ප්‍රධාන කාර්යාලය,
කොළඹ 1, 70.2..3.

3-1244

---

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

දකුණු කොට්ඨාශය. ඇල්පිටිය දිස්ත්‍රික්කය.

### අම්බලන්ගොඩ-ඇල්පිටිය-පිටිගල පාරේ අංක 11/13 දරණ පාලමේ කොන්ක්‍රීට් තට්ටුව නැවත දැමීම

1970.3.1 වන දින සිට ඉහත සඳහන් මාර්ගය ගමනා ගමනය සඳහා නැවත විවෘත කරන බව මෙයින් දන්වනු ලැබේ.

ඇස්. සෙල්වදොරේ,
මහා මාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1970. 2. 22,
මහා මාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 1.

3-1170

ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

**1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දින වලට පෙරදින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

**7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම් පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඊට අඩුව ... ... ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

**12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. 68.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 0 | ... | 60 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 0 | ... | 42 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 50 | ... | 51 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලතදී එක කොටසක් ... ... ... | 0 50 | ... | 0 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 0 | ... | 0 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 30 | ... | 0 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 60 | ... | 0 15 |

**දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

**1970**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| මාර්තු ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද ... | 70. 2.27 සිකුරාද | පෙ.ව. | 12.0 |
| | 70. 3.13 සිකුරාද ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 3.20 සිකුරාද .. | 70. 3.13 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 3.26 බ්‍රහස්පතින්ද ... | 70. 3.19 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| අප්‍රේල් ... | 70. 4. 3 සිකුරාද ... | 70. 3.25 බදාද | ප.ව. | 3.30 |
| | 70. 4.10 සිකුරාද ... | 70. 4. 3 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.17 සිකුරාද ... | 70. 4. 8 බදාද | ප.ව. | 3.30 |
| | 70. 4.24 සිකුරාද .. | 70. 4.17 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.30 බ්‍රහස්පතින්ද ... | 70. 4.23 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මැයි ... | 70. 5. 8 සිකුරාද ... | 70. 4.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 5.15 සිකුරාද ... | 70. 5. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.22 සිකුරාද ... | 70. 5.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.29 සිකුරාද ... | 70. 5.22 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූනි ... | 70. 6. 5 සිකුරාද ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද ... | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද ... | 70. 6.11 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද ... | 70. 6.18 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |

1970 මාර්තු මස 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.



ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.